# ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව

இலங்கை கடற்றொழில் துறைமுகங்கள் கூட்டுத்தாபனம்

CEYLON FISHERY HARBOURS CORPORATION



## වාර්ෂික වාර්තාව

## 2013

පිටුව

1. ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාවේ දැක්ම 03

2. ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාවේ මෙහෙවර 04

3. ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාවේ නෛතිකභාවය හා පරමාර්ථය 05

4. අධ්‍යක්ෂ මණ්ඩලය 06

5. ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාවේ හැඳින්වීම සහ කාර්යභාරය 07 - 09

6. ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව සතු වරායන් 10 - 25

7. ගිණුම්කරණ ප්‍රතිපත්ති 26 - 28

8. මූල්‍ය ප්‍රකාශන 29 - 39

9. විගණන හා කළමණාකාරණ කමිටු රැස්වීම 40

10. විගණනකාධිපති වාර්ථාව 41 - 53

## 01. දැක්ම

ධීවර කර්මාන්තයෙහි මූලික සම්පතක් වෙමින් හා දේශීය ධීවර ප්‍රජාවන් තුළ නව ප්‍රබෝධයක් ඇති කරමින් කලාපයේ සමුද්‍රාශ්‍රිත මත්ස්‍ය කර්මාන්තයෙහි නිරතවන  ව්‍යවසායකයිනට ගුණාත්මක හා ඉස්තරම් ගණයේ පහසුකම් සපයන්නෙකු වීම.

## 02. මෙහෙවර

අවශ්‍ය  ආධාරක යටිතල පහසුකම් සහිතව ධීවර ප්‍රජාවට සියළු නවීන පහසුකමක්ම සපයනු පිණිස ගුණාත්මක වරායාශ්‍රිත ඉහලම සේවාවක් සැපයීම සහ  වානිජමය අතින් ඵලදායික ව්‍යවසායන් තුළින් වරායන් වැඩි දියුණු කරමින්  ධීවර ප්‍රජාවට ස්වංපෝෂිත බව සාක්ෂාත් කරදීම.

### 03. ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාවේ නෛතිකභාවය හා පරමාර්ථ

★ 1957 අංක 49 දරණ රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ 2 වන වගන්තියේ 1 වැනි උප වගන්තිය අනුව 1972-02-11 දිනැති අංක 14,996/18 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ පල කල ගැසට් නිවේදනය අනුව 1972.04.01 දින ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව පිහිටවනු ලැබීය.

**පරමාර්ථ :-**

I ධීවර වරායන් ,නැංගුරම් පොළවල් , මුහුදු ව්‍යුහයන් සහ අනෙකුත් වෙරළ පහසුකම් සැලසුම් කිරීම, සැලසුම් නිර්මාණය කිරීම සහ ඉදිකිරීම.

II ධීවර වරායන් ,නැංගුරම් පොළවල් , මුහුදු ව්‍යුහයන් සහ අනෙකුත් වෙරළ පහසුකම් පිහිටුවීම, ක්‍රියාත්මක කිරීම, පාලනය කිරීම සහ නඩත්තු කිරීම.

III ධීවර වරායන් ,නැංගුරම් පොළවල් සහ අනෙකුත් වෙරළ පහසුකම් කළමණාකරනය කිරීම.

IV ධීවර යාත්‍රා සඳහා අලුත්වැඩියා සහ නඩත්තු පහසුකම් සැපයීම.

V ශීතාගාර, අයිස් යන්ත්‍රාගාර සහ අනෙකුත් ශීතාගාර පහසුකම් පිහිටුවීම, ක්‍රියාත්මක කිරීම සහ නඩත්තු කිරීම.

VI ජලය සැපයීම, ඉන්ධන සැපයීම, ලිහිසි තෙල් සැපයීම, විදුලිය සැපයීම, අයිස් සැපයීම, ශීතාගාර පහසුකම් සැපයීම සහ ධීවර කර්මාන්තය උදෙසා සහ ධීවර කාර්මිකයන්ට ආනුශංගික වන අනෙකුත් සේවාවන් සැපයීම.

VII ධීවර වරායන් ,නැංගුරම් පොළවල් , මුහුදු ව්‍යුහයන්, ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය තුලට ගැනෙන අනෙකුත් සංවිධාන වලට ආරක්ෂක සේවා විධිවිධාන සැලසීම සහ ඒ වෙනුවෙන් ගාස්තු කුලී සහ වෙනත් ගෙවීම් අය කිරීම.

VIII ශ්‍රී ලංකා අනන්‍යයන ආර්ථික කලාපය පිලිබඳ මෙහෙයුම්, පාලන සහ ආවේක්ෂණ කටයුතු කිරීම.

IX සංස්ථාව විසින් වරායන් සහ නැංගුරම් පොළවල් තුල ධීවර යාත්‍රා වලට, ධීවර කාර්මිකයන්ට වෙනත් අනෙකුත් පුද්ගලයින්ට සපයනු ලබන පහසුකම් සේවාවන් සහ සැපයීම් වෙනුවෙන් වරුය ගාස්තු, ප්‍රදීපාගාර ගාස්තු, තටාක ගාස්තු, ටොන් ප්‍රමාණ ගාස්තු, ගොඩබෑමේ ගාස්තු ආදිය ඇතුලත් පොදු වරාය ගාස්තු කුලී ගාස්ත බෝට්ටු බලපත්‍ර ගාස්තු නියම නිරීම සහ අය කිරීම.

## 04 අධ්‍යක්‍ෂ මණ්ඩලය

ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාවේ අධ්‍යක්‍ෂ මණ්ඩලය සභාපතිවරයාද ඇතුළුව අධ්‍යක්‍ෂකවරුන් හත් (7) දෙනෙකුගෙන් සමන්විත වේ.

| | |
|---|---|
| උපාලි ලියනගේ මහතා | සභාපති |
| නීල් මුණසිංහ මහතා | කළමණාකාර අධ්‍යක්‍ෂ - අධ්‍යක්‍ෂ මණ්ඩල සාමාජික |
| දර්ශනා සේනානායක මිය | අධ්‍යක්‍ෂ මණ්ඩල සාමාජික |
| කේ.ඩී. නන්දසේන මහතා | අධ්‍යක්‍ෂ මණ්ඩල සාමාජික |
| ඩබ්.ඒ.සී. හේමකුමාර මහතා | අධ්‍යක්‍ෂ මණ්ඩල සාමාජික |
| ඩබ්.ඒ.ඒ.ඩී.පී. අමරදිවාකර මහතා | අධ්‍යක්‍ෂ මණ්ඩල සාමාජික |
| ඩබ්.ආර්.එන්. කුමාර ද සිල්වා මහතා | අධ්‍යක්‍ෂ මණ්ඩල සාමාජික |
| ජී.ජී.පී. අබේසේනර මහතා | සාමාන්‍යාධිකාරී - නිරීක්‍ෂක සාමාජික |
| | |
| නයනා කරුණාරත්න මහත්මිය | ලේකම් (වැඩ බලන) - අධ්‍යක්‍ෂ මණ්ඩල |

| | | |
|---|---|---|
| විගණකවරු | - | විගණකාධිපති දෙපාර්තමේන්තුව |
| බැංකු කරුවෝ | - | ලංකා බැංකුව |
| | | මහජන බැංකුව |

## 05. ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාවේ ඉතිහාසය

ලංකා ආණ්ඩුව යටතේ පැවති ධීවර කොමිෂන් සභාව ධීවර වරායන් හි දිය කඩන ඉදිකල අතර ප්‍රථම ධීවර වරාය වුයේ බේරුවල ධීවර වරායයි. 1980 දශකයේ ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව සියළු වාණිජ කටයුතු ධීවර සමුපකාර සමිති වලට සහ පුද්ගලික අංශයට පැවරීමට තීරණය කර ඇත. මෙහිදී ධීවර වරායන් සහ නැංගුරම් පොළවල් සැලසුම් කිරීම සහ නිර්මාණය කිරීමද මුහුදු ව්‍යුහයන් නඩත්තු කිරීම, ඉදිකිරීම ක්‍රියාත්මක කිරමේ ආර්ථික අධීක්ෂණයද නඩත්තු කටයුතු සඳහා ධීවර වරායන් වල කැණීම් කටයුතු කිරීමද ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව විසින් සිදු කරණ ලදී.

1991 හි ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව ප්‍රතිව්‍යුහගතකරණ වැඩ පිලිවෙලට ලක් වූ නිසා සංස්ථාවේ සෙවක සංඛ්‍යව 129 දක්වා අඩු කරන ලදී. නැවත වරාය නවීකරණය කිරීම, නව වරායන් ඉදි කිරීම නිසා මෙම සංස්ථාවට අවශ්‍ය සේවක සංඛ්‍යාව ගණනය කර හා වර්ගීකරණයෙන් පසුව සේවක සංඛ්‍යාව 1015 දක්වා ඉහල නැංවීම සඳහා 2013 වසරේදී භාණ්ඩාගාර අනුමැතිය ලබා ගන්නා ලදී. 1994 අවසන් වන විට ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව සතු වරායන් 10 ක් දක්වා වර්ධනය වී තිබිණ. 1995 වසරේදී ආසියානු සංවර්ධන බැංකුවේ ආධාර ඇතිව බේරුවල, ගාල්ල, මිරිස්ස, පුරාණවැල්ල සහ කිරින්ද යන වරායන් වලට නව කළමණාකරණ ව්‍යුහයක් හඳුන්වා දෙන ලදී. විවෘත ගේට්ටු ක්‍රමය අත් හිටුවා ධීවර වරාය නීතිගත සංස්ථාව නව වරාය කළමණාකරණ වැඩ සටහනකට අවතීර්ණ වු අතර වරායන් කළමණාකරුවන් යටතේ වරාය පාලනය වන ක්‍රම වේදයක් ආරම්භ කරන ලදී. මේ යටතේ සීමා තාප්ප ඉදි කිරීම, ආරක්ෂක සේවා ක්‍රියාත්මක කිරීම වරාය පරිහරණය මනා පාලනයක් ඇති කිරීම සිදු කරන ලදී.

2004 සුනාමි ව්‍යසනය වන විට ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාවේ ශ්‍රී ලංකාව වටා ධීවර වරායන් 12 ක් ක්‍රියාත්මක වූ අතර වරායන් කිහිපයක් ඇරෙන්නට සුනාමි ව්‍යසනයෙන් ධීවර වරායන් 10 ක් (පානදුර, බේරුවල, හික්කඩුව, ගාල්ල, මිරිස්ස, පුරාණවැල්ල, තංගල්ල, කුඩාවැල්ල, කිරින්ද) ඇතුළුව වෙරලාශ්‍රිත යටිතල පහසුකම් මුහුදු ආශ්‍රිත ඉදිකිරීම්, දිය කඩන, වැලි කඩන ඇතුළු යටිතල පහසුකම් වලට විශාල ලෙස හානි වූ අතර ධීවර වරාය සතුව තිබූ වැලි ගොච්චා කැණීම් යාත්‍රාවට හානි සිදුවන ලදී. මෙම ව්‍යසනයෙන් හානියට පත් වරායන් 10 ක ප්‍රතිසංස්කරණ කටයුතු සහ නව ඉදි කිරීම් සහ නැංගුරම් පොළ, තොටුපළ විශාල සංඛ්‍යාවක් ප්‍රතිසංස්කරණ පහත රාජ්‍යයන් ආයතන සහ සංවිධාන මගින් සිදු කරන ලදී.

| | |
|---|---|
| **USAID ආධාර** | හික්කඩුව, මිරිස්ස, පුරාණ වැල්ල ධීවර වරාය ප්‍රතිසංස්කරණය සහ කිරින්ද ධීවර වරාය බර වාහන අලුත් වැඩියාව සහ වරාය බේසම කැණීම් කිරීම්<br>ඇමරිකානු ඩොලර් මිලියන 13. |

**චීන සමූහාණ්ඩු ආධාර** පානදුර, බේරුවල, කුඩාවැල්ල වරාය ප්‍රතිසංස්කරණය සහ වැඩි දියුණු කිරීම

රුඃ මිලියන 900

**ජපන් රාජ්‍ය ආධාර** ගාල්ල සහ තංගල්ල ධීවර වරාය ප්‍රතිසංස්කරණය සහ වැඩි දියුණු කිරීම

රුපියල් මිලියන 700.

**World Vision ආධාර** කිරින්ද ධීවර වරාය ප්‍රතිසංස්කරණ කටයුතු

ඇමරිකානු ඩොලර් මිලියන 10.

**UNDP ආධාර** කිරින්ද, කොඩ්බේ, කුඩාවැල්ල වරාය නේවාසිකාගාර, සනීපාරක්ෂක පහසුකම් වැඩි දියුණු කිරීම සහ තංගල්ල, පුරාණ වැල්ල, මිරිස්ස, ගාල්ල, හික්කඩුව, බේරුවල, මෝදර, කල්පිටිය, කොඩ්බේ, කුඩාවැල්ල වරායන් සඳහා ජෙනරේටර් සහ ට්‍රැක්ටර් ලබා දීම.

රුඃ මිලියන 159.

**Nestle lanka ආධාර** කොඩ්බේ, ගාල්ල, මීගමුව වරායන් සඳහා දැල් සැකසුම් ශාලා, ජල ගබඩා ටැංකි, නේවාසිකාගාර, අභ්‍යන්තර මාර්ග ප්‍රතිසංස්කරනය

රුඃ මිලියන 60.

**ADB/GOSL ආධාර** හම්බන්තොට, අම්බලංගොඩ, හලාවත ධීවර වරායන් අංග සම්පූර්ණ නව ධීවර වරායන් ඇති කිරීම.

රුඃ මිලියන 1027.

**අයිස්ලන්ත ආධාර** තොටුපල 25 ක් සංවර්ධනය

**ICEIDA** රු ඃ මිලියන 119.

**ADB/TARP** නැංගුරම්පල 07 ක් සංවර්ධනය

**ප්‍රතිපාදන** රු ඃ මිලියන 411.

**ADB/GOSL** වාලච්චේන ධීවර වරාය නැවත ප්‍රතිසංස්කරණය කර නවීකරණය, කොඩ්බේ

**NECCDEP** වරාය නවීකරණය කිරීම හරහා නව වේදිකා බැම්මක් ඉදි කිරීම , ඉන්ධන

| | |
|---|---|
| | පහසුකම් වැඩි දියුණු කිරීම වරාය බේසමේ ප්‍රමාණය වැඩි කිරීම |
| | රු : මිලියන 590 |
| **ග්‍රීක් රජයේ ආධාර** | දොඩන්දූව මීගමුව නව ධීවර වරාය ඉදි කිරීම |
| **Helanic Aid** | රු : මිලියන 120. |
| **FAO ආධාර CIDA** | නැංගුරම් පොල 80 ක් සංවර්ධනය ,ධීවර වරාය නීතිගත සංස්ථාව තාක්‍ෂණික පුහුණු කටයුතු |
| | ඇමරිකානු ඩොලර් මිලියන 4.7 |
| **IFAD** | නැංගුරම් පොල 03 ක් සහ තොටුපල 18 ක් සංවර්ධනය, නිල් වැල්ල , සුදු වැල්ල ධීවර වරායන් ලෙසට සංවර්ධනය |
| | ඇමරිකානු ඩොලර් මිලියන 12 |
| **චීන සමූහාණ්ඩු** | පානදුර ධීවර වරායේ දකුණු දිය කඩනය මී: 340 ක් දිගු කිරීම |
| **ආධාර** | රු : මිලියන 575 |

නෙදර්ලන්ත (ORET/GOSL) ආධාර යටතේ (යුරෝ මිලියන 53 ක්) සියළු නවීන පහසුකම් වලින් අංග සම්පූර්ණ වරායක් ලෙස දික්ඕවිට ධීවර වරාය, 2013 වන විට වරාය පද්ධතියට එක්වන ලදී.

ජාත්‍යන්තර තත්වයට සහ ප්‍රමිතීන්ට අනුකූලව වැඩි දියුණු කරන ලද ගොඩබෑමේ පහසුකම්, මත්ස්‍ය සැකසීම, ඇසුරුම් කිරීම ඇතුලු අපනයන තත්වයේ සියළු පහසුකම් වලින් සමන්විතව දික්ඕවිට ධීවර වරාය ඉදිකරන ලදී. මේ අනුව මෝදර ධීවර වරායේ තිබූ සීමිත යටිතල පහසුකම් පිරිමැසෙන අතර ගුවන් තොටුපළට ආසන්න වීම, මීගමු කලපුවෙන් මෙහෙයුම් කටයුතු සිදුකල ධීවරයින්ට විධිමත් සෞඛ්‍යාරක්ෂිත ගොඩබෑමේ පහසුකම්, ප්‍රධාන මත්ස්‍ය වෙළඳ පොළ වෙත ආසන්නව ආරක්ෂිත නැංගුරම් පහසුකම් ලැබීම මේ මගින් ඉටුවනු ඇත.

කසල සහ අපවිත්‍ර ජලය සෞඛ්‍යාරක්ෂිතව අපහරණය කිරීම හා කළමණාකරණය කිරීම සඳහා වූ නවීන තාක්‍ෂණික පහසුකම් මෙම වරායේ අන්තර්ගත වීම විශේෂිතය.

## 6. ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව සතු වරායන්




ආදායම
රු මිලියන
වරාය ආදායම
2011
2012
2013
70.00
60.00
50.00
40.00
30.00
20.00
10.00
-
බෙරුවල
ගාල්ල
මිරිස්ස
පුරාණවැල්ල
තංගල්ල
කිරින්ද
කොඩ්බේ
දොඩන්දූව
හික්කඩුව
කල්පිටිය
කුඩාවැල්ල
මෝදර
පානදුර
මීගමුව
හම්බන්තොට
අම්බලන්ගොඩ
හලාවත
වාලච්චේන
ගිල්වැල්ල
දික්´ඕට
සුදුවැල්ල


ලාභය
රු මිලියන
වරාය මෙහෙයුම් ලාභය
2011
2012
2013
50.00
40.00
30.00
20.00
10.00
-
(10.00)
(20.00)
බෙරුවල
ගාල්ල
මිරිස්ස
පුරාණවැල්ල
තංගල්ල
කිරින්ද
කොඩ්බේ
දොඩන්දූව
හික්කඩුව
කල්පිටිය
කුඩාවැල්ල
මෝදර
පානදුර
මීගමුව
හම්බන්තොට
අම්බලන්ගොඩ
හලාවත
වාලච්චේන
ගිල්වැල්ල
දික්´ඕට
සුදුවැල්ල

### 6.2.1 මෝදර ධීවර වරාය

හෙක්ටයාර් 2.3 ක බේසමේ පරිමාවකින් යුතු මෝදර ධීවර වරායේ ගැඹුර මීටර් 4 - 5 ක් අතර වේ. වේදිකා බැම්මේ දිග මීටර් 128.7 ක් හා වරාය මුවදොර ගැඹුර මීටර් 6 - 8 ක් අතර වේ.

මෝදර ධීවර වරායේ පහසුකම් ලබන ධීවර යාත්‍රා බහුතරයක් අයත්වන්නේ විදේශ සමාගම්වලට වේ. මෙම වරායේ ලියාපදිංචි නැව් සඳහා නැංගුරම් පහසුකම් ජලය විදුලිය ඉන්දන ලිහිසි තෙල් ගෑස් සැපයීම හා විදේශ යාත්‍ර සඳහා එළවළු පළතුරු සිසිල් කල බීම වර්ග සපයමින් ආදායමක් ලබා ගනී.

2013 වසර අවසානයේ මෝදර ධීවර වරයේ සේවා සැපයීමේ කටයුතු දික්ඔිවිට ධීවර වරාය වෙත මාරු කරන ලදී.




### 6.2.2 පානදුර ධීවර වරාය.

පානදුර ධීවර වරාය ගැඹරු මීටර 2 කින් හා වේදිකා බැම්මේ දිග මීටර 75 කින් යුක්ත වේ.

පානදුර ධීවර වරායේ කාර්යාල පහසුකම්, නැංගුරම් පහසුකම්, ජලය, විදුලිය ඉන්ධන සැපයීමෙන් ආදායම් උපයයි. වැඩිම ආදායමක් උපයන්නේ වැලි විකිණීමෙනි.




### 6.2.3 බේරුවල ධීවර වරාය

හෙක්ටෙයාර් 10 ක බේසම් පරිමාණයකින් සමන්විත බේරුවල ධීවර වරායේ ගැඹුර මීටර් 2.5 කි. මෙම වරායට අයත් ගොඩබිම හෙක්ටයාර් 7.05 ක් වන අතර වේදිකා බැම්මේ දිග මීටර් 215 ක් වේ.

බේරුවල ධීවර වරාය කාර්යාලීය පහසුකම්, නැංගුරම් පහසුකම්, ඉන්ධන, ජලය පහසුකම් සපයන අතර ඉන්ධන විකිනීමෙන් සැලකිය යුතු ආදායමක් උපයා ගනී.



### 6.2.4 අම්බලංගොඩ ධීවර වරාය

අම්බලංගොඩ ධීවර වරායේ බේසම් පරිමාව හෙක්ටයාර් 6.4 ක් හා මීටර් 3.5 ක ගැඹුරකින් සමන්විත වේ. වේදිකා බැම්මේ දිග මීටර් 112 කි.




### 6.2.5 හික්කඩුව ධීවර වරාය

හෙක්ටයාර් 6.3 ක බේසම් පරිමාවකින් යුතු හික්කඩුව ධීවර වරායේ ගැඹුර මීටර 2.5 කි. වේදිකා බැම්මේ දිග මීටර් 135.9 කින් හා වරායේ බිම් ප්‍රමාණය හෙක්ටයාර් 2.94 කින් සමන්විතය.

සමාලොචිත වර්ෂය තුලදී කාර්යාල කටයතු විධිමත් කරමින් ජලය, විදුලිය, ඉනධන, ධීවර යාත්‍රා වලට ලබාදීමෙන් වෙරළ පහසුකම් සැපයීමෙන් ආදායම් උපයා ඇත. අනෙකුත් අදායම් හා සසඳන කළ වැලි විකිනීමෙන් වැඩි ආදායමක් උපයා ඇත.




### 6.2.6 දොඩංදූව ධීවර වරාය

වරාය මගින් ජලය විදුලිය ඉන්ධන ලබා දීමෙන් වෙරළ පහසුකම් සපයන අතර සමාලෝචිත වසර තුල වැලි විකිණීමෙන් සැලකිය යුතු ආදායමක් ලබා ගනී.




### 6.2.7 ගාල්ල ධීවර වරාය

හෙක්ටයාර් 04 ක බේසමේ පරිමිවකින් සමන්විත ගාල්ල ධීවර වරායේ සාමාන්‍ය ගැඹුර මීටර් 03 - 06 දක්වා වේ. මෙම වරායට අයත් ගොඩබිම හෙක්ටෙයාර් 1.5 කින් සමන්විතය. මීටර් 304 ක් දිග වේදිකා බැම්මකින් වරාය සමන්විත වන අතර මීටර් 91 ක් දිග සේවා ජැටියක්ද අයත්ය.

ගාල්ල ධීවර වරාය වෙරළ පහසුකම් සපයන අතර ජලය විදුලිය ඉන්ධන හා වරාය පහසුකම් ලබා දීමෙන් සැලකිය යුතු ආදායමක් උපයා ගනී. මාළු වෙන්දේසි ශාලා දැල් සැකසීමේ පහසුකම් ආපන ශාලා හා සනීපාරක්ෂක පහසුකම් වරාය පහසුකම් අතර වේ. සමාලෝචිත වසර තුල නැංගුරම් ආදායම් බදු ආදායම් හා දොඹකර ආදායම් වැදගත් වේ.




### 6.2.8 මිරිස්ස ධීවර වරාය.

මිරිස්ස ධිවර වරායේ බේසමේ පරිමාණය හෙක්ටයාර් 07 කින් හා ගොඩබිම හෙක්ටයාර් 2.44 කින් යුක්ත වේ. වරායේ ගැඹුර මීටර 2.5 කින් හා වේදිකා බැම්මේ දිග මීටර් 355 කින් සමන්විතය.

සමාලෝචිත වර්ෂය තුල ජලය, විදුලිය හා ඉන්ධන ලබා දෙමින් නැංගුරම් පහසුකම් සපයා වරාය ආදායම් ලබා ගෙන ඇති අතර පෞද්ගලික අංශයේ අයිස් යන්ත්‍රාගාර මගින් වරායේ අයිස් අවශ්‍යතා සම්පූර්ණ කර ගනු ලබයි.




### 6.2.9 පුරාණවැල්ල ධීවර වරාය

පුරාණවැල්ල ධීවර වරායේ බේසමේ පරිමාව හෙක්ටෙයාර් 14.2 කි. වරායේ ගැඹුර මීටර් 2.5 ක් වේ. වරායට අයත් ගොඩබිම් ප්‍රමාණය හෙක්ටයාර් 4.96 ක් හා මීටර් 265 ක දිග වේදිකා බැම්මකින් මෙම වරාය සමන්විත වේ.

සමාලෝචිත වසර තුල නැංගුරම් ගාස්තු ජලය ඉන්ධන සහ විදුලිය විකිණීමෙන් හා දොරටු අවසර පත් ලබාදීමෙන් ආදායමක් උපයා ගනී.



### 6.2.10 කුඩාවැල්ල ධීවර වරාය

බේසමේ පරිමාව හෙක්ටයාර් 13.1 කින් හා වරායේ ගැඹුර මීටර 2.5 සිට මීටර් 3.0 දක්වා වු අතර සමාලෝචිත වසර තුලදී වරාය නවීකරණය කිරීමට ආරම්භ කරන ලදී.

ධීවර වරායේ පහසුකම් අතර ජලය, විදුලිය, ඉන්ධන ලබා දීමත් එමගින් ආදායම් ලබන අතර නැංගුරම් කිරීමෙන් හා දොරටු අවසරපත් මගින් ද ආදායම් උපයා ගනී.




### 6.2.11 නිල්වැල්ල ධීවර වරාය

නව වරායක් වන නිල්වැල්ල ධීවර  වරායේ වෙරළ පහසුකම් ලබා දෙමින් නැංගුරම් ගාස්තු දොරටු අවසරපත් මගින් හා ජලය ඉන්ධන විදුලිය පහසුකම් ලබා දෙමින් ආදායමක් උපයා ගනී.




### 6.2.12 තංගල්ල ධීවර වරාය

හෙක්ටයාර් 2.5 ක බේසම් පරිමාවකින් හා මීටර් 2.5 ක ගැඹුරකින් සමන්විත තංගල්ල ධීවර වරායේ වේදිකා බැම්මේ දිග මීටර් 261 කි.

ධීවර යාත්‍රා සඳහා වෙරල පහසුකම් හා ජලය ඉන්ධන විදුලිය ලබා දීමෙන් හා නැංගුරම් ගාස්තු අයකිරීමෙන් වැලි විකිණීමෙන් දොරටු අවසර පත් නිකුත් කිරීමෙන් හා බදු ආදායම් මගින් සමාලෝචිත වසර තුල ආදායම් උපයාගෙන ඇත.



### 6.2.13 හම්බන්තොට ධීවර වරාය

හම්බන්තොට ධීවර වරායේ බේසම් පරිමාව හෙක්ටයාර් 5.8 කින් හා වරායේ ගැඹුර මීටර් 3.5 ක් වන අතර භූමි ප්‍රදේශය හෙක්ටයාර් 1.65 ක් වේ. දියකඩනයේ දිග මීටර් 275 කි.

හම්බන්තොට ධීවර වරාය මගින් වෙරළ පහසුකම් ජලය විදුලිය ඉන්ධන ලබා දීමෙන් හා වැලි විකිණීමෙන් ආදායම් ලබා ගනී.




### 6.2.14 කිරින්ද ධීවර වරාය

හෙක්ටයාර් 3.5 ක ගොඩබිම් ප්‍රමාණයක් හා මීටර් 173 ක් දිග වේදික් බැම්මකින් සමන්විත මෙම වරාය හෙක්ටයාර් 3.6 ක බේසම් පරිමාවකින් යුත්තය. වරායේ ගැඹුර මීටර් 2.5 කි.

කිරින්ද වරාය මගින් කාර්යාල පහසුකම් සපයන අතර වැලි විකිණීමෙන් වැඩිම ආදායම් වාර්තාවක් ඇති කිරින්ද වරාය නැංගුරම් ගාස්තු ජලය විදුලිය හා ඉන්ධන ලබා දීමෙන් හා අයිස් විකිණීමෙන් වරාය ආදායමක් උපයා ගනී.




## 6.2.15 වාලච්චේන ධීවර වරාය.

වාලච්චේන ධීවර වරායේ තටාංගනය මීටර් 3 ක් දක්වා ගැඹුරත් මීටර් 275 ක වේදිකා බැම්මක් ඇත.

වාලච්චේන ධීවර වරාය මගින් ලබා දෙන වෙරළ පහසුකම් අතර ජලය, විදුලිය හා ඉන්ධන පහසුකම් සැපයීමත්, නැංගුරම් ගාස්තු, දොරටු අවසර පත් ගාස්තු හා වැලි විකිණීමෙන් ද වරාය ආදායම් උපයයි.



### 6.2.16 කොඩ්බේ ධීවර වරාය

වරාය සතු භූමි ප්‍රමානය හෙක්ටයාර් 9.23 ක් හා මුහුදු කලාපය හෙක්ටයාර් 20 කින් සමන්විත වන කොඩ්බේ ධීවර වරාය දිවයිනේ පිහිටි විශාලතම ධිවර වරාය වේ. ප්‍රධාන වේදිකා බැම්මේ දිග ටීටර් 152 ක් ද මීටර් 25 ක් දිග ත්‍ස්වා ජැටියක් සතු මෙම වරායේ තටාකාංගනයේ ගැඹුර මීටර් 6 අතර වේ

කොඩ්බේ ධීවර වරාය ජලය විදුලිය ඉන්ධන සැපයීමෙන් හා නැංගුරම් ගාස්තු, දොරටු අවසර පත් මගින් ද බදු කුලී මගින් ද ආදායම් උපයා ගනී.




### 6.2.17 කල්පිටිය ධීවර වරාය.

කල්පිටිය ධීවර වරායේ බේසම් පරිමාව හෙක්ටෙයාර් 2.0 ක් හා වරායේ ගැඹුර මීටර් 2.5 කි. මීටර් 57.2 ක් දිග ජැටියක් හා මීටර් 115.8 ක් දිග වේදිකා බැම්මකින්ද හෙක්ටයා්ර් 0.49 ක් වු වරාය බිම් ප්‍රමාණයක් ද කල්පිටිය ධීවර වරාය සතු වේ.

කල්පිටිය ධීවර වරාය මගින් වෙරළ පහසුකම් සනීපාරක්ෂක පහසුකම් ඉන්ධන, ජලය හා විදුලිය සැපයීමෙන් දොරටු අවසර පත් මගින් හා බදුකුලී ලබා ගැනීමෙන් ආදායම් උපයා ගනී.




### 6.2.18 හලාවත ධීවර වරාය

හලාවත ධීවර වරායේ වේදිකා බැම්ම මීටර් 136 ක දිගින් යුතු වේ.

හලාවත ධීවර වරාය ආදායම් වන්නේ නැංගුරම් ගාස්තු, බදු කුලී ආදායම් වන අතර ජලය හා විදුලිය ලබා දීමෙන් ද ආදායමක් ලබා ගනී.



### 6.2.19 මීගමුව ධීවර වරාය

හෙක්ටයාර් 0.4 ක බිම් ප්‍රදේශයක් ඇති මීගමුව ධීවර වරායේ ගැඹුර මීටර් 03 කි. ජැටියේ දිග 88 ක් වේ.

2009.09.13 සිට අංග සම්පූර්ණ වරායක් ලෙස ආරම්භ කර ඇති මීගමුව ධීවර වරාය ධීවර ජනතාව සඳහා වෙරළ පහසුකම් සපයමින් ජලය විදුලිය ඉන්ධන ලබා දීමෙන් හා ආදායමක් ලබා ගනී.




### 6.2.20 දික්ඕවිට ධීවර වරාය

දික්ඕවිට ධීවර වරාය ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව ඉදිකරන ලද යටිතල පහසුකම් සහිත වරායකි.

හෙක්ටයාර් 8.1 ක් වූ වරාය භූමියකින් හා හෙක්ටයාර් 11.7 ක් වූ තටාංගන ප්‍රදේශයකින් (උතුරු සහ දකුණු පර්යන්ත දෙකකින්) වරාය සමන්විත වේ. වරායේ ගැඹුර මීටර් 3.5 - 5.0 කි. ජැටියේ දිග 45.0 * 8 ක් වේ.

උතුරු පර්යන්තයේ දේශීය එක් දින හා බහුදින ධීවර යාත්‍රා 450 කට ආරක්ෂිත නැංගුරම් පහසුකම් සැපයිය හැකිය.

දකුණු පර්යන්තයේ ජාත්‍යන්තර වෙළඳපල අරමුණු කර ගත් අපනයනය සඳහා මසුන් ගොඩබෑම සිදුකරන අතර එය ජාත්‍යන්තර ට්‍රෝලර් යාත්‍රා 40 කට ආරක්ෂිත නැංගුරම් පහසුකම් සැපයිය හැකිය. එහිදී මසුන් ගොඩබෑම සිදු කරනු ලබන්නේ නාවික තටාංගනය

උපයෝගී කරගත් Conveyor Belt මගින් වන අතර එවැනි පහසුකම් සහිත පළමු ධීවර වරාය දික්ඕවිට වරාය වේ. මීට අමතරව දකුණු පර්යන්තයේ ගොඩබාන මසුන් ජාත්‍යන්තර ප්‍රමිතියට අනුකූලව සැකසුම් කිරීමට ඉදිකරන ලද මත්සයසැකසුම් ඒකක 03 කින් සමන්විතය.



# 7. ගිණුම්කරණ ප්‍රතිපත්ති

## 7.1 ව්‍යාපාරය හා විශේෂ ගිණුම්කරණ ප්‍රතිපත්ති හා භාවිතය පිළිබඳ විස්තරය.

ලංකා දීවර වරාය නීතිගත සංස්ථාව පිහිටුවන ලද්දේධීවර වරායන් ඉදිකිරීමටත් නඩත්තු කිරීමටත් එක්දින හා බහුදින ධීවර යාත්‍රා සඳහා නැංගුරම් පහසුකම් සලසා දීමටත්ය. ධීවර යාත්‍රාවලට අවශ්‍ය ඉන්ධන පහසුකම් ලබා දීම සඳහා ඉන්ධන පිරවුම්හල් ධීවර වරායන් ආශ්‍රිතව පවතී. මෙම ප්‍රධාන අරමුණු දෙකට අමතරව පසුව ආරක්‍ෂක සේවාවන් සැපයීම හා බහු පදනම මත පහසුකම් සැලසීම සිදුකර ඇත. විශේෂයෙන් ධීවර අමාත්‍යාංශය යටතේ පවතින ආයතන පෞද්ගලික අංශය හා සම්බන්ධිත වෙනත් ආයතන වෙත මෙම සේවාවන් ලා දීම සිදුකර ඇත. පසුව වැලි හැරීම සහ අලෙවි කිරීම ධීවර වරායන් කිහිපයක් ආශ්‍රිතව සිදු කෙරෙන අතර ධීවර වරාය නීතිගත සංස්ථාවේ කාර්යභාරය ඒ අනුව පුළුල් වී ඇත.

## 7.2 ගිණුම්කරණ උපකල්පණ

යෝග්‍ය ගිණුම් කරණ ප්‍රමිතීන්ට අනුකූලව මෙම ගිණුම් සකස් කිරීම සිදු කර ඇති අතර එහි ඓතිහාසික පිරිවැය සංකල්පය යටතේ (අඛණ්ඩ පැවැත්ම පදනම මත) හා ආදායම් වියදම් උපචිත සංකල්පය යටතේ ගිණුම්ගත කර ඇත.

## 7.3 ලැබීම් / ප්‍රතිපාදන

මහා භාණ්ඩාගාරයෙන් හා අනෙකුත් ආධාර සංවිධාන වලින් ලැබෙන ආධාර / ලැබීම් ප්‍රාග්ධන හා ප්‍රතිවර්තන වශයෙන් හඳුනාගත් අතර ඒ අනුව ගිණුම්ගත කර ඇත.

## 7.4 ප්‍රාග්ධන වියදම්

ප්‍රාග්ධන වියදම් නොනිම් වැඩ ගිණුමට හර කර ඇති අතර තවත් ප්‍රාග්ධන වියදම් කිහිපයක් ප්‍රාග්ධන වැඩ වශයෙන් ඍජුවම ප්‍රාග්ධනිත කර ඇත.

### 7.5 වගකීම් සහ වෙන්කිරීම්

1983 අංක 12 දරණ පාරිතෝෂික ගෙවීම් පනත යටතේ ගෙවිය යුතු විශ්‍රාම පාරිතෝෂික වශයෙන් වෙන් කිරීම් කර ඇති අතර මෙය සංස්ථාවට බැඳී වසරකට වැඩි සේවා කාලයක් සම්පූර්ණ කර ඇති සියළුම සේවකයන් වෙනුවෙන් ගෙවීම් කරනු ලබයි.

### 7.6 දේපළ යන්ත්‍ර හා උපකරණ අත්පත් කර ගැනීම ( අස්පෘෂ්‍ය හා අනෙකුත් ප්‍රාග්ධනිත පිරිවැයන් සම්බන්ධව )

දේපළ යන්ත්‍ර හා උපකරණ පිරිවැයට දක්වා ඇති අතර ක්ෂය කිරීම සිදු කර ඇත්තේ සරල මාර්ග ක්‍රමය යටතේ අපේක්ෂිත ජීව කාලය පදනම් කර ගෙනය. අපේ පිරිවැය පදනමට ඇතුලත් වනුයේ මූලික වශයෙන් අත්පත් කරගත් දිනයට අනුව සාධාරණ වටිනාකමක් දක්වා ඇති ව්‍යාපාර කටයුතු වලදී අත්පත් කර ගත් නිශ්චිත වත්කම්ය.

ඉතිරිව පවතින බදු කාලය හෝ අපේක්ෂිත ප්‍රයෝජනවත් ජීව කාලය යන දෙකෙන් වඩා අඩු නිර්නායකය මත පදනම්ව සරල රේඛීය ක්‍රමය භාවිතා කර බදු අයිතිය වර්ධනය වීම ක්‍රම ක්ෂය (amortize) කර ඇත.

### 7.7 ක්ෂය වීම්

ස්ථාවර වත්කම් ක්ෂය කිරීම සරල මාර්ග ක්‍රමය අනුව සිදු කර ඇත. (ගැනුම් මාසයේ සිට විකුණන මාසය දක්වා සැලකිල්ලට ගෙන ඇත.)

- ඉඩම් -
- ගොඩනැගිලි 2.5%
- අභ්‍යන්තර මාර්ග හා සීමා තාප්ප 2.5%
- දියකඩනය හා මායිම් තාප්ප 2.5%
- යන්ත්‍ර උපකරණ 10%
- ආම්පන්න / කාර්යාපීය උපකරණ 10%
- ලී බඩු හා උපකරණ 10%
- කැණීම් යාත්‍රා හා බෝට්ටු 10%
- අන්තර්ජාලය හා තොරතුරු තාක්‍ෂණය 20%

- මෝටර් රථ 10%
- බර වාහන 10%

**7.8 විදේශ මුදල් ඒකක ගණුදෙනු**

විදේශ මුදල් වලින් සිදුකෙරෙන ගනු දෙනු එම ගණුදෙනුව සිදු කෙරෙන අවස්ථාවේ පවතින විදේශ විනිමය අනුපාතයන්ට අනුව සිදු කර ඇත. කෙසේ හෝ විදේශ මුදල් වලින් පවත්වාගෙන යනු ලබන බැංකු ගිණුමක් හරහා ගණුදෙනුවක් සිදු වු විට එය දේශීය අනුපාතයට වාර්තා කර ඇත. එවැනි බැංකු ගිණුම් වල පවතින ශේෂයන් වර්ෂය අවසානයේදී පවතින විදේශ විනිමය අනුපාතයන්ට ගලපා ඇත. ජංගම වත්කම් හා වගකීම් වර්ෂය අවසානයේදී පවතින විදේශ විනිමය අනුපාතයන්ට අනුව නැවත දක්වා ඇත. වර්ෂය අවසානයේ ඇති එම අගයන් හා සත්‍ය අනුපාතයන් අතර වෙනස එම ගිණුමේ ලාභයක් හෝ අලාභයක් ලෙස හඳුනාගෙන ඇත.

**7.9 බදුකරණය**

ආදායම් බදු

ප්‍රවර්ථන වර්ෂයට අදාලව බදු මත ආදායම සඳහා වෙන් කිරීම් සිදු කර නොමැත.

# 08. මූල්‍ය ප්‍රකාශන

ලංකා ධීවර වරාය නිතිගත සංස්ථාව

2013 දෙසැම්බර් 31 වන දිනට මූල්‍ය තත්ත්වය

| | සටහන් | 2013 | 2012 | 1 ජනවාරි 2012 |
|---|---|---|---|---|
| **වත්කම්** | | රු | රු | රු |
| **ජංගම නොවන වත්කම්** | | | | |
| දේපළ පිරියත සහ උපකරණ | 1 | 4,473,127,854 | 4,562,198,461 | 4,616,327,810 |
| කෙරීගෙන යන ප්‍රාග්ධනික වැඩ | 2 | 6,988,609 | 6,327,289 | 18,704,293 |
| විලම්භිත වියදම් | | - | - | 548,352 |
| ගිණුම්වලින් කපා හැරිය යුතු ශේෂයන් | | 81,769,596 | 81,769,596 | 81,769,596 |
| | | **4,561,886,059** | **4,650,295,347** | **4,717,350,051** |
| **ජංගම වත්කම්** | | | | |
| තොග | 3 | 48,245,900 | 49,101,884 | 32,692,624 |
| වෙළඳ සහ අනෙකුත් ලැබිය යුතු දෑ | 3 | 260,112,957 | 210,196,836 | 219,626,537 |
| කලින් ගෙවීම් | 3 | 72,881,532 | 63,887,796 | 61,522,747 |
| බැංකු ශේෂයන් | 3 | (23,807,545) | 798,734 | 35,482,297 |
| මුදල් සහ මුදල් වලට සමාන දෑ | 3 | 24,224,842 | 24,270,452 | 15,083,454 |
| | | **381,657,686** | **348,255,701** | **364,407,658** |
| **මුළු වත්කම්** | | **4,943,543,745** | **4,998,551,048** | **5,081,757,709** |
| | | | | |
| **ස්කන්ධය සහ බැරකම්** | | | | |
| **ප්‍රාග්ධන සහ සංචිත** | | | | |
| නිකුත් කළ ප්‍රාග්ධන | | 350,099,843 | 350,099,843 | 350,099,843 |
| ප්‍රාග්ධනික ලැබීම් | 4 | 1,006,589,223 | 1,152,035,460 | 1,005,810,617 |
| සංචිත | 5 | 5,178,924,020 | 5,096,108,234 | 5,141,757,300 |
| ප්‍රොම්පිච්ඩ් ලැබීම් | | 2,215,769 | 2,215,769 | 2,215,769 |
| සම්මුචිත ලාභ/අලාභ | 15 | (2,050,489,666) | (2,008,739,407) | (1,744,576,529) |
| **මුළු ස්කන්ධය** | | **4,487,339,189** | **4,591,719,899** | **4,755,307,000** |
| | | | | |
| **ජංගම නොවන වගකීම්** | | | | |
| විලම්භිත වගකීම් | | 1,653,400 | 1,653,400 | 1,653,400 |
| වසරකින් පසු කල්බදු මූල්‍ය වගකීම් | 6 | 5,264,349 | 8,757,315 | 8,532,902 |
| පාරිතෝෂිකය සඳහා වෙන්කිරීම් | 7 | 130,847,770 | 110,500,139 | 89,874,467 |
| | | **137,765,519** | **120,910,854** | **100,060,769** |
| **ජංගම වගකීම්** | | | | |
| වෙළඳසහ අනෙකුත් ගෙවිය යුතු දෑ | 8 | 312,737,660 | 279,643,908 | 222,226,408 |
| වසරක් තුළ දී කල්බදු මූල්‍ය වගකීම් | 6 | 5,701,377 | 6,276,387 | 4,163,532 |
| | | **318,439,037** | **285,920,295** | **226,389,940** |
| **මුළු ස්කන්ධය සහ වගකීම්** | | **4,943,543,745** | **4,998,551,048** | **5,081,757,709** |

1971 අංක 38 දරණ මුදල් පනතේ විධිවිධාන අනුව මෙම මූල්‍ය ප්‍රකාශණ පිලයෙල කර ඇති බව සහතික කරමි

SAMANTHI PERERA
FINANCE MANAGER
CEYLON FISHERY HARBOURS CORPORATION
ROCK HOUSE LANE
COLOMBO - 15.

.....................
මූල්‍ය කළමණාකරු

අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් අත්සන් කරන ලද මෙම මූල්‍ය ප්‍රකාශණ පිළයෙළ කිරීම සහ ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වගකිවයුතු වේ

.....................
සභාපති

A. Abeygunasekara
Chairman
Ceylon Fishery Harbours Corporation

.....................
සාමාන්‍යාධිකාරී

R. M. G. Sarath Bandara
B.Sc. Eng (Sri Lanka), MIE(SL), Dip (HE) DELFT, FIE(SL), Int (PE), Chartered Engineer
General Manager
Ceylon Fishery Harbours Corporation
Rock House Lane, Colombo 15.

# ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව

## විස්තීර්ණ ආදායම් වියදම් ප්‍රකාශය

### දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වසර

| | සටහන් | 2013 රු. | 2012 රු. |
|---|---|---|---|
| අය භාර - භාණ්ඩාගාර පුනරාවර්ථන ප්‍රදානයන් | | 108,000,000 | 108,780,000 |
| අය භාර - පුනරාවර්ථන වියදම් සඳහා ප්‍රාග්ධනික ප්‍රදානයන් | | 55,441,170 | - |
| මෙහෙයුම් ප්‍රතිඵල | 9 | 293,162,663 | 136,414,518 |
| | | 456,603,833 | 245,194,518 |
| සේවක පිරිවැය | 10 | (195,030,798) | (182,383,881) |
| අනෙකුත් මෙහෙයුම් වියදම් | | | |
| ආයතනික වියදම් | 11 | (10,773,544) | (9,594,293) |
| පරිපාලන වියදම් | 12 | (248,867,716) | (245,621,969) |
| අළුත් වැඩියා සහ නඩත්තු වියදම් | 13 | (29,935,298) | (50,184,405) |
| මෙහෙයුම් වලින් ලාභ/අලාභ | | (28,003,523) | (242,590,030) |
| මූල්‍ය පිරිවැය | 14 | (13,507,848) | (16,236,642) |
| බදු වලට පෙර ලාභ/අලාභ | | (41,511,370) | (258,826,672) |
| බදු වියදම් | | - | - |
| බදු වලට පසු ලාභ/අලාභ | | (41,511,370) | (258,826,672) |
| කාල පරිච්ඡේදය සඳහා ලාභය/අලාභය | | (41,511,370) | (258,826,672) |

## ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව
**2013 වසර සඳහා වන මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

| | 2013 | 2012 |
|---|---|---|
| | රු | රු |
| **<u>මෙහෙයුම් ක්‍රියාකාරකම් මගින් ලැබූ මුදල් ප්‍රවාහය</u>** | | |
| බදු වලට පෙර ලාභය | (41,511,370) | (258,826,672) |
| ලාභාලාබ ගිණුම් සඳහා පෙර වර්ෂ සම්බන්ධ ගැලපිම් ගැලපීම් | (238,889) - | |
| ක්ෂය කිරීම් | 173,225,325 | 164,998,596 |
| විශ්‍රාම පාරිතෝෂික සඳහා වූ ප්‍රතිපාදන | 27,234,547 | 22,194,716 |
| පොළී | 7,808,262 | 3,672,078 |
| කාරක ප්‍රාග්ධනයෙහි වැඩිවීම්/ (අඩුවීම්) | | |
| වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු ණය වල _වැඩිවීම්/ (අඩුවීම්) | (49,916,121) | 9,429,701 |
| තොග වල වැඩිවීම්/ (අඩුවීම්) | 855,984 | (16,409,261) |
| වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු ණය වල වැඩිවීම්/ (අඩුවීම් | 33,093,752 | 57,417,500 |
| ජංගම කල්බදු වගකීම් වල වැඩිවීම්/ (අඩුවීම්) | (575,010) | 2,112,855 |
| පෙර ගෙවීම් | (8,993,736) | (2,365,048) |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් මගින් ලැබූ මුදල් ප්‍රමාණය | **140,982,743** | **(17,775,535)** |
| ගෙවන ලද පොළී | (7,808,262) | (3,672,078) |
| ගෙවන ලද පාරිතෝෂ | (6,886,916) | (1,569,044) |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් මගින් ලැබූ ශුද්ධ මුදල් ප්‍රමාණය** | **126,287,565** | **(23,016,657)** |
| **<u>ආයෝජන ක්‍රියාකාරකම් මගින් ලැබූ මුදල් ප්‍රවාහය</u>** | | |
| දේපළ පිරියත හා උපකරණ මිල දී ගැනීම් | (84,816,037) | (98,492,244) |
| සංචිත | 82,815,786 | (337,077) |
| ආයෝජන - ප්‍රාග්ධන අරමුදල් | 76,000,000 | 96,125,000 |
| අඩු කලා ප්‍රාග්ධන අරමුදල් ක්‍රමක්ෂය | (221,446,237) - | |
| **ආයෝජන ක්‍රියාකාරකම් වල යෙදූ ශුද්ධ මුදල් ප්‍රමාණය** | **(147,446,488)** | **(2,704,321)** |
| **මුල්‍ය ක්‍රියාකාරකම් වලින් ලැබූ මුදල් ප්‍රවාහයම මුල්‍ය කල්බදු වගකීම** | (3,492,966) | 224,413 |
| **මුල්‍ය ක්‍රියාකාරකම් වල යෙදූ ශුද්ධ මුදල් ප්‍රමාණය** | **(3,492,966)** | **224,413** |
| **මුදල් හා මුදල් වලට සමාන දෑ වල ශුද්ධ වැඩිවීම/(අඩුවීම)** | **(24,651,889)** | **(25,496,565)** |
| **වසර මුල දී තිබූ මුදල් හා මුදල්වලට සමාන දෑ ( ජනවාරි 01)** | **25,069,186** | **50,565,751** |
| **වසර අග දී තිබූ මුදල් හා මුදල්වලට සමාන දෑ ( දෙසැ 31 ට)** | **417,297** | **25,069,186** |

**ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව**
**2013 දෙසැම්බර් 31 වන දිනට ස්කන්ධයෙහි වෙනස්වීම් සම්බන්ධ ප්‍රකාශනය**

| | නියුක්තකල ප්‍රාග්ධනය | ප්‍රාග්ධන ප්‍රදානයන් | සමුච්චිත ලාභය | සංචිත | ලැබීම් | එකතුව |
|---|---|---|---|---|---|---|
| | රු | රු | රු | රු | රු | රු |
| **2013 ජනවාරි 01 දිනට ශේෂය** | **350,099,843** | **1,152,035,460** | **(2,008,739,407)** | **5,096,108,234** | **2,215,769** | **4,591,719,899** |
| භාණ්ඩාගාරයෙන් ලැබුන ප්‍රාග්ධනය | - | 76,000,000 | - | - | - | 76,000,000 |
| ප්‍රාග්ධන ප්‍රදානයෙන් ලාභාලාභ ගිණුමට පුණරාවර්ථන කොටස | - | (55,441,170) | - | - | - | (55,441,170) |
| ප්‍රාග්ධන ප්‍රදාන ක්‍රමක්ෂය | - | (166,005,067) | - | - | - | (166,005,067) |
| පෙර වසර ගැලපුම් | - | - | (238,889) | - | - | (238,889) |
| වසර තුළ සංචිත වෙනස්වීම් | - | - | - | 82,815,787 | - | 82,815,787 |
| වසරේ අලාභය | - | - | (41,511,370) | - | - | (41,511,370) |
| **2013 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **350,099,843** | **1,006,589,223** | **(2,050,489,667)** | **5,178,924,020** | **2,215,769** | **4,487,339,189** |

**සටහන 01**

| **ස්ථිර වත්කම්** | **2013** රු | **2012** රු |
|---|---|---|
| ඉඩම් | 1,287,928,850 | 1,287,928,850 |
| ගොඩනැගිලි | 847,175,522 | 845,204,978 |
| මාර්ග සහ මායිම් තාප්ප | 73,834,388 | 74,019,801 |
| දිය කඩනය බාදන වාරකය සහ වරාය වේදිකාව | 2,268,951,078 | 2,266,371,838 |
| යන්ත්‍ර සූත්‍ර | 243,029,123 | 242,755,564 |
| මෝටර් වාහන | 95,540,062 | 95,540,062 |
| බර වාහන | 92,994,987 | 20,792,406 |
| කාර්යාලීය සහ අනෙකුත් උපකරණ | 84,131,530 | 78,030,856 |
| ලී බඩු සහ සවිකිරීම් | 17,033,710 | 16,423,412 |
| කැණීම් යන්ත්‍ර දෙක සහ බෝට්ටු | 362,816,423 | 363,816,423 |
| අන්තර් ජාල තොරතුරු පද්ධතිය | 7,152,327 | 5,784,283 |
| පරිගණක මෘදුකාංග පද්ධතිය | 6,015,588 | 5,889,086 |
| ඉන්ධන බෙදා හැරීමේ ඒකකය | 12,144,162 | 12,144,162 |
| ට්‍රොලි | 57,700 | 57,700 |
| ජල සැපයුම් | 679,483 | 679,483 |
| ක්ෂය කිරීම් සඳහා වෙන් කිරීම් | (926,357,079) | (753,240,443) |
| | **4,473,127,854** | **4,562,198,461** |

**සටහන් 02**

| **කෙරී ගෙන යන ප්‍රාග්ධන වැඩ** | **2013** රු | **2012** රු |
|---|---|---|
| ගොඩනැගිලි | 2,926,564 | 6,257,789 |
| විදුලිය | 54,178 | 69,500 |
| යන්ත්‍ර සූත්‍ර | 2,170,423 | - |
| මායිම් තාප්ප | 1,837,444 | - |
| | **6,988,609** | **6,327,289** |

**සටහන් 03**

| **ජංගම වත්කම්** | **2013** රු | **2012** රු |
|---|---|---|
| ඉතිරි තොගය | 48,245,900 | 49,101,884 |
| **වෙළඳ සහ අනෙකුත් ලැබිය යුතු දෑ** | | |
| ණයගැතියෝ | 247,397,069 | 197,151,267 |
| අමාත්‍යංශ ලැබීම් සහ වෙනත් කොන්ත්‍රාත් | 2,150,000 | 2,150,000 |
| කාර්යාලීය ණයගැති | 10,565,888 | 10,895,569 |
| | 260,112,957 | 210,196,836 |
| **තැන්පතු අත්තිකාරම් හා පෙරගෙවීම්** | | |
| ඇප තැන්පත් | 500,000 | 500,000 |
| තැන්පත් - ඉන්ධන | 495,000 | 95,000 |
| වෙනත් තැන්පත් | 4,509,025 | 4,489,025 |
| විශේෂ අත්තිකාරම් | 20,184,214 | 13,197,527 |
| ගෑස් සිලින්ඩර තැන්පත් | 442,125 | 303,000 |
| පෙර ගෙවීම් - මිළ දී ගැනීම් | 46,351,168 | 45,303,244 |
| බැංකු ඇප තැන්පත් | 400,000 | - |
| | 72,881,532 | 63,887,796 |

**බැංකු ශේෂ**

| | | |
|---|---|---|
| කල්පිටිය ඉන්ධන ගිණුම | 443,279 | (852,366) |
| කල්පිටිය රැස් කිරීමේ ගිණුම | 55,589 | 42,422 |
| දියවර ගිණුම 1658 | (217,987) | 138,082 |
| ප්‍ර/කා ගිණුම 1883 | (487,261) | 178,688 |
| ගි/අංක 1725 | (40,651,892) | (15,965,052) |
| ගි/අංක 1446 | 615,615 | (1,293,214) |
| ගි/අංක 1236 | (3,428,326) | (4,406,765) |
| ගි/අංක 1931 | (1,476,660) | (618,204) |
| තංගල්ල ඉන්ධන ගිණුම | 1,294,583 | 4,342,361 |
| වෛද්‍යාධාර ණය ගිණුම | 2,496 | 184,502 |
| තංගල්ල රැස් කිරීමේ ගිණුම | 167,619 | 53,353 |
| බේරුවල ඉන්ධන ගිණුම | 312,562 | (3,539,252) |
| බේරුවල රැස් කිරීමේ ගිණුම | 302,015 | 191,262 |
| බේරුවල බැංකු ගිණුම- සහනසැළ | 1,470 | 1,470 |
| බේරුවල ම.යාන්ත්‍රික වැඩපළ ගිණුම | 8,312 | 127,649 |
| මිරිස්ස ඉන්ධන ගිණුම | (682,471) | 2,580,187 |
| මිරිස්ස රැස් කිරීමේ ගිණුම | 16,924 | 82,312 |
| කිරින්ද ඉන්ධන ගිණුම | 729,606 | 2,036,846 |
| කිරින්ද රැස් කිරීමේ ගිණුම | 52,909 | 104,398 |
| ගාල්ල ඉන්ධන ගිණුම | 2,451,917 | 1,660,207 |
| ගාල්ල රැස් කිරීමේ ගිණුම | 13,507 | 428,904 |
| කල්මුණේ ගිණුම 1976 | 12,716 | 12,716 |
| මීගමුව ගිණුම 8354 | 1,591,909 | 1,711,798 |
| මීගමුව රැස් කිරීමේ ගිණුම | 28,520 | 198,681 |
| ත්‍රිකුණාමල ඉන්ධන ගිණුම | 418,189 | 5,281,454 |
| ත්‍රිකුණාමල රැස්කිරීමේ ගිණුම | 200,819 | 114,598 |
| කුඩාවැල්ල ඉන්ධන ගිණුම | (7,452,746) | (6,973,842) |
| කුඩාවැල්ල රැස් කිරීමේ ගිණුම | 5,985,450 | 5,984,710 |
| හික්කඩුව ඉන්ධන ගිණුම | 2,376,510 | 856,615 |
| හික්කඩුව රැස් කිරීමේ ගිණුම | 116,111 | 76,392 |
| ප්‍ර/කා ගිණුම 4461 | (980) | 741,418 |
| පුරාණවැල්ල ඉන්ධන ගිණුම | (84,099) | (2,600,701) |
| පුරාණවැල්ල රැස් කිරීමේ ගිණුම | 294,917 | 237,583 |
| මෝදර විදේශ විනිමය මුදල් ගිණුම | 614,815 | 824,138 |
| මෝදර රැස් කිරීමේ ගිණුම | 183,586 | 237,362 |
| වෙල්ලමන්කර | (29,737) | (29,737) |
| බෙලිඅත්ත බැංකු ගිණුම | (8,371) | (8,371) |
| දෙව්විමනවත්ත ගිණුම | (186,641) | (186,641) |
| පානදුර රැස් කිරීමේ ගිණුම | 28,145 | 16,676 |
| පානදුර ඉන්ධන ගිණුම | 363,568 | 913,169 |
| හම්බන්තොට ඉන්ධන ගිණුම | 843,512 | 546,370 |
| හම්බන්තොට රැස් කිරීමේ ගිණුම | 20,073 | 82,419 |
| දොඩන්දූව ඉන්ධන ගිණුම | 1,122,360 | 1,460,686 |
| අම්බලන්ගොඩ ඉන්ධන ගිණුම | 4,652,416 | 1,100,133 |
| මිරිස්ස | 73,868 | 73,868 |
| දොඩන්දූව රැස් කිරීමේ ගිණුම | 157,294 | 96,647 |
| ආපනශාලා ගිණුම | - | - |
| හලාවත රැස් කිරීමේ ගිණුම | 1 | 3,014 |
| වාලච්චේන රැස් කිරීමේ ගිණුම | 78,661 | 227,816 |
| වාලච්චේන ඉන්ධන ගිණුම | 428,271 | 516,664 |
| අම්බලන්ගොඩ රැස්කිරීමේ ගිණුම | 95,295 | 75,537 |

| | | |
|---|---|---|
| නිල්වැල්ල ඉන්ධන ගිණුම | (16,907) | 3,527,463 |
| නිල්වැල්ල රැස්කිරීමේ ගිණුම | 161,600 | 172,310 |
| සුදුවැල්ල ඉන්ධන ගිණුම | 2,500 | - |
| සුදුවැල්ල් රැස්කිරීමේ ගිණුම | 136,329 | |
| බංකු ගිනුම දික්ඕවිට ඉන්ධන | 4,038,371 | 15,000 |
| බංකු ගිනුම දික්ඕවිට රැස්කිරීම | 422,323 | 15,000 |
| | **(23,807,545)** | **798,734** |
| **අත ඉතිරි මුදල්** | | |
| සුළු මුදල් | 512,076 | 512,076 |
| අත ඉතිරි මුදල් | 240,137 | 240,137 |
| අත ඉතිරි බේරුවල -(ඉන්ධන සහ රැස්කිරීම්) | 3,605,689 | 4,891,995 |
| අත ඉතිරි ගාල්ල -(ඉන්ධන සහ රැස්කිරීම්) | 960,776 | 1,891,495 |
| අත ඉතිරි මිරිස්ස -(ඉන්ධන සහ රැස්කිරීම්) | 2,262,312 | 505,141 |
| අත ඉතිරි පුරාණවැල්ල් -(ඉන්ධන සහ රැස්කිරීම්) | 6,789,648 | 5,470,141 |
| අත ඉතිරි තංගල්ල -(ඉන්ධන සහ රැස්කිරීම්) | 458,363 | 715,793 |
| අත ඉතිරි කිරින්ද -(ඉන්ධන සහ රැස්කිරීම්) | 1,301,636 | 673,176 |
| අත ඉතිරි කොඩ්බේ -(ඉන්ධන සහ රැස්කිරීම්) | 2,039,074 | 895,552 |
| අත ඉතිරි දොඩන්දූව -(ඉන්ධන සහ රැස්කිරීම්) | 168,127 | 179,372 |
| අත ඉතිරි හික්කඩුව -(ඉන්ධන සහ රැස්කිරීම්) | 206,546 | 743,940 |
| අත ඉතිරි කල්පිටිය -(ඉන්ධන සහ රැස්කිරීම්) | 476,816 | 1,094,673 |
| අත ඉතිරි කුඩාවැල්ල් -(ඉන්ධන සහ රැස්කිරීම්) | 55,823 | 2,063,795 |
| අත ඉතිරි පානදුර -(ඉන්ධන සහ රැස්කිරීම්) | 447,233 | 524,808 |
| අත ඉතිරි මීගමුව -(ඉන්ධන සහ රැස්කිරීම්) | 1,421,912 | 577,360 |
| අත ඉතිරි අම්බලන්ගොඩ -(ඉන්ධන සහ රැස්කිරීම්) | 916,086 | 2,310,023 |
| අත ඉතිරි හම්බන්තොට -(ඉන්ධන සහ රැස්කිරීම්) | 57,652 | 484,911 |
| අත ඉතිරි වාලච්චේනෙයි -(ඉන්ධන සහ රැස්කිරීම්) | 212,054 | 348,960 |
| අත ඉතිරි දික්ඕවිට -(ඉන්ධන සහ රැස්කිරීම්) | 790,100 | |
| අත ඉතිරි නිල්වැල්ල -(ඉන්ධන සහ රැස්කිරීම්) | 873,578 | 54,625 |
| සුළු මුදල් - පුරාණවැල්ල | 35,790 | 169 |
| සුළු මුදල් - බේරුවල | 12,810 | - |
| සුළු මුදල් - ගාල්ල | 38,138 | - |
| සුළු මුදල් - තංගල්ල | 19,971 | - |
| සුළු මුදල් - කිරින්ද | 157 | - |
| සුළු මුදල් - ත්‍රිකුණාමලය | 14 | - |
| සුළු මුදල් - දොඩන්දූව | 8,026 | - |
| සුළු මුදල් - හික්කඩුව | 15,365 | - |
| සුළු මුදල් - මෝදර | 4,175 | - |
| සුළු මුදල් - මීගමුව | 2,363 | - |
| සුළු මුදල් - අම්බලන්ගොඩ | 16,935 | - |
| සුළු මුදල් - පානදුර | 19,775 | - |
| සුළු මුදල් - නිල්වැල්ල | 12,566 | |
| සුළු මුදල් - ප්‍රධාන කාර්යාලය | 23,571 | |
| සුළු මුදල් - දික්ඕවිට | 5,892 | 684 |
| සුළු මුදල් - මිරිස්ස | 30,749 | 890 |
| සුළු මුදල් - කුඩාවැල්ල | 0 | 2,570 |
| සුළු මුදල් - හම්බන්තොට | 23,745 | 20,473 |
| සුළු මුදල් - වැලිගොච්ච | 9,106 | 14,879 |
| සුළු මුදල් - රුහුණුපුතා | | 13,259 |
| සුළු මුදල් - හලාවත | 8,741 | |
| සුළු මුදල් - සලාපුර කිඳුරි | 39,240 | |
| සුළු මුදල් - නිල්දියවර | 6,374 | 9,570 |
| සුළු මුදල් - තඩානෝ යන්ත්‍රය | 1,420 | 12,000 |
| සුළු මුදල් - බේරුවල වැඩපළ | 11,933 | 385 |

| | | |
|---|---|---|
| සුළු මුදල් - ආහාරපාන - නිල්දියවර | 14,600 | |
| සුළු මුදල් - ආහාරපාන - සලාපුර කිඳුරි | 11,250 | |
| සුළු මුදල් - ආහාරපාන - රුහුණු පුතා | 6,500 | |
| සුළු මුදල් - ආහාරපාන - වැලිගොව්වා | 50,000.00 | 17,600 |
| | **24,224,842** | **24,270,452** |
| | **381,657,686** | **348,255,702** |

**සටහන් 04**

| **භාණ්ඩාගාරයෙන් ප්‍රාග්ධන ප්‍රදාන ලැබීම්** | **2013**<br>**රු** | **2012**<br>**රු** |
|---|---|---|
| ප්‍රදානයන් - ප්‍රාග්ධන | 1,172,594,290 | 1,152,035,460 |
| අඩුකළා - ප්‍රාග්ධන ප්‍රදාන ක්‍රමක්ෂය | (166,005,067) | - |
| | **1,006,589,223** | **1,152,035,460** |

**සටහන් 05**

| **ප්‍රාග්ධන සංචිත** | **2013**<br>**රු** | **2012**<br>**රු** |
|---|---|---|
| වත්කම් මාරු කිරීම - අමාත්‍යාංශයෙන් | 136,787,573 | 136,787,573 |
| අමාත්‍යාංශයෙන් ලැබුණු දීමනා | 292,788,606 | 209,972,820 |
| විදේශීය ආධාර | 139,337,507 | 139,337,507 |
| ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණන සංචිත | 2,686,972,668 | 2,686,972,668 |
| විනාශ වූ වත්කම් වෙනුවෙන් වෙන් කිරීම | 945,559,937 | 945,559,937 |
| ආසියානු සංවර්ධන බැංකු ලැබීම් | 838,173,606 | 838,173,606 |
| ආසියානු සංවර්ධන බැංකු ප්‍රදානයන් | 7,862,323 | 7,862,323 |
| වෙනත් ප්‍රදාන | 131,441,801 | 131,441,801 |
| | **5,178,924,020** | **5,096,108,234** |

**සටහන් 06**

| **මූල්‍ය කල් බදු** | **2013**<br>**රු** | **2012**<br>**රු** |
|---|---|---|
| **වර්ෂයක් තුළ ගෙවිය යුතු මූල්‍ය කල් බදු** | | |
| මෝටර් ජීප් රථය -රෙක්ස්ටන් එක්ස් ඩි අයි 7 | 2,415,479 | 2,854,657 |
| මෝටර් කාර් රථය -බිලු බර්ඩ් | 1,655,914 | 1,655,914 |
| මෝටර් කාර් රථය - මැස්ඩා | 1,629,984 | 1,765,816 |
| **මුළු වගකීම** | **5,701,377** | **6,276,387** |
| | | |
| **වර්ෂයකින් පසු ගෙවිය යුතු මූල්‍ය කල් බදු** | | |
| මෝටර් ජීප් රථය -රෙක්ස්ටන් එක්ස් ඩි අයි 7 | 2,439,460 | 4,037,223 |
| මෝටර් කාර් රථය -බිලු බර්ඩ් | 878,599 | 1,941,250 |
| මෝටර් කාර් රථය - මැස්ඩා | 1,946,290 | 2,778,842 |
| **මුළු වගකීම** | **5,264,349** | **8,757,315** |

**සටහන් 07**

| **පාරිතෝෂික** | **2013**<br>**රු** | **2012**<br>**රු** |
|---|---|---|
| පාරිතෝෂික සඳහා වෙන් කිරීම - වසර මුල | 110,500,139 | 89,874,467 |
| පාරිතෝෂික සඳහා වෙන් කිරීම -2013 | 27,234,547 | 22,194,716 |
| | 137,734,686 | 112,069,183 |
| පාරිතෝෂික සඳහා ගෙවීම් | 6,886,916 | 1,569,044 |
| පාරිතෝෂික 2013/12/31 | **130,847,770** | **110,500,139** |

**සටහන් 08**

| | 2013 රු | 2012 රු |
|---|---|---|
| **ජංගම වගකීම්** | | |
| ණයහිමියෝ | 279,620,423 | 250,279,469 |
| උපචිත වියදම් | 33,117,236.84 | 29,364,439 |
| | **312,737,660** | **279,643,908** |

**සටහන් 09**

| **මෙහෙයුම් ආදායම්** | | 2013 රු | 2012 රු |
|---|---|---|---|
| කුලී ආදායම (ප්‍ර/කා) | | | 18,000 |
| කුලී ආදායම - වැලිගොව්වා | | 6,653,571 | 1,800,000 |
| පොළී ආදායම | | 43,756 | 661,872 |
| ආපසු නොගෙවන ටෙන්ඩර් තැන්පතු | | 139,500 | 304,500 |
| මෙහෙයුම් ලාභය / ආලාභය ) වරායන් | Att. No. O2 | 71,470,737 | 44,767,038 |
| ආරක්ෂක කටයුතු වලින් ලද ආදායම : අමාත්‍යාංශය හා නාරා ) | | 13,024,662 | 12,887,784 |
| NAQDA ව්‍යාපෘතියෙන් ලද ආදායම | | | 4,408,740 |
| වෙරළ සංරක්ෂණ ව්‍යාපෘතියෙන් ලද ආදායම | | 1,008,000 | 2,221,100 |
| දඩ සහ අධිභාර | | 85,345 | 16,065 |
| සැපයුම්කරුවන් ලියාපදිංචි ගාස්තු | | 114,000 | 259,250 |
| කැණීම ආදායම - | | 34,819,490 | 72,906,521 |
| වැඩබිම ප්‍රතිඵල - බේරුවල ( අලාභය) | | (11,262,259) | (11,586,400) |
| වෙනත් ආදායම | | 177,065,860 | 7,750,049 |
| | | **293,162,663** | **136,414,518** |

**සටහන් 10**

| | 2013 රු | 2012 රු |
|---|---|---|
| **සේවක පඩිනඩි** | | |
| වැටුප් ගෙවීම් සහ දීමනා (ප්‍ර/කා) | 178,136,708 | 168,647,164 |
| සේවක අර්ථසාධක අරමුදල (15%) | 13,721,263 | 11,228,513 |
| සේවා නියුක්ති භාරකාර අරමුදල (3%) | 2,762,728 | 2,508,205 |
| සේවක අර්ථසාධක අරමුදල - අධිභාර | 410,098 - | |
| | **195,030,798** | **182,383,881** |

**සටහන් 11**

| | 2013 රු | 2012 රු |
|---|---|---|
| **ආයතනික වියදම්** | | |
| කුලී වරිපනම් හා බදු | 90,032 | 523,026 |
| විදුලිය | 9,081,426 | 7,316,621 |
| ජලය | 1,602,085 | 1,754,646 |
| | **10,773,544** | **9,594,293** |

**සටහන් 12**

| | 2013 රු | 2012 රු |
|---|---|---|
| **පරිපාලන වියදම්** | | |
| කාර්යාල පිරිසිදු කිරීම | 2,926,345 | 1,712,998 |
| අධ්‍යක්ෂ ගාස්තු | 287,000 | 304,000 |
| ගමන් ගාස්තු හා යැපීම් දීමනා | 5,116,928 | 3,828,419 |
| මුද්‍රණ හා ලිපි ලේඛණ | 2,940,123 | 3,159,483 |
| දුරකථන | 2,662,691 | 3,001,358 |
| අභ්‍යන්තර දුරකථන පද්ධති ගාස්තු | 492,379 | 953,407 |

| | | |
|---|---|---|
| තැපැල් ,ටෙලිග්‍රෑම්, අන්තර්ජාල, පුවත් පත් හා සගරා | 456,921 | 584,383 |
| පුවත්පත් හා සගරා | 233,618 | 215,201 |
| ප්‍රවාහන | 1,927,230 | 1,117,609 |
| සංග්‍රහ | 961,116 | 798,508 |
| දැන්වීම් ප්‍රචාරක හා ප්‍රදර්ශන | 1,463,458 | 2,544,973 |
| සුභසාධන හා වෛද්‍ය වියදම් | 1,716,428 | 2,649,687 |
| වාහන සඳහා ඉන්ධන | 14,935,721 | 13,642,338 |
| බරවාහන සඳහා ඉන්ධන | 528,848 | 129,984 |
| විමර්ශන ගාස්තු | | 30,555 |
| ජල සැපයීම් ගාස්තු | - | 269,663 |
| නීති ගාස්තු | 1,943,406 | 1,608,205 |
| ආරක්ෂක ගාස්තු | | 6,400 |
| ආධාර | 170,869 | 436,270 |
| උපදේශන දීමනා | | 29,655 |
| නිල ඇඳුම් | 1,399,260 | 2,850,517 |
| විධායක  වෘත්තීය දීමනා | 230,046 | 555,953 |
| පුහුණුවීම් | 668,020 | 886,283 |
| විදේශ ගමන් | 549,360 | 446,785 |
| මිනුම් ගාස්තු | 51,802 | 98,231 |
| වැඩපළ වියදම් | 34,781 | 270,176 |
| රක්ෂණ හා බලපත්‍ර ගාස්තු | | |
| - බර වාහන | 1,170,350 | 958,277 |
| - සුළු වාහන | 114,592 | 135,916 |
| - කැණීම් යන්ත්‍ර | 425,315 | 215,093 |
| - වැලි | 223,700 | 800 |
| - ගුවන් විදුලි | 3,571 | |
| - මුදල් | 1,198,995 | 1,147,596 |
| විවෘත කිරීමේ උත්සව | 18,025 | 97,827 |
| කම්කරු වන්දි | 104,085 | 95,085 |
| වාහන කුලී වියදම් | 606,531 | 693,153 |
| විවිධ | 214,365 | 31,629 |
| පාරිතෝෂිත දීමනා සඳහා වෙන් කිරීම | 27,234,547 | 22,194,716 |
| ක්ෂය වීම | 173,225,325 | 164,998,596 |
| බොල් ණය | 1,683,023 | 4,387,539 |
| පරිවර්ථන ගාස්තු | - | 27,500 |
| විගණන ගාස්තු | | 386,400 |
| මුළුතැන්ගෙයි උපකරණ | 4,500 | 18,682 |
| ව්‍යාපෘති පඩිනඩි ( වෙරළ සංරක්ෂණ සහ  නක්ඩා) | 602,640 | 5,215,943 |
| විවිධ වියදම් | 44,721 | 93,185 |
| සහනසල වියදම් | 2,336 | 13,318 |
| තල්මසුන් නැරඹීමේ වියදම් | 294,745 | 2,511,672 |
| දිරිසවිය සමාජ පහසුකම් සැපයීමේ වියදම් | - | 268,000 |
| | **248,867,716** | **245,621,969** |

**සටහන් 13**

| | **2013** | **2012** |
|---|---|---|
| **අළුත් වැඩියා හා නඩත්තු වියදම්** | **LKR** | **LKR** |
| ගොඩනැගිලි | 404,245 | 1,660,230 |
| මෝටර් වාහන | 6,996,221 | 7,426,592 |
| උපකරණ | 1,497,279 | 3,119,694 |
| නැව් සහ බෝට්ටු | 20,423,470 | 36,940,385 |
| යන්ත්‍ර | 614,083 | 1,037,505 |
| | **29,935,298** | **50,184,405** |

## සටහන් 14

| | 2013<br>රු | 2012<br>රු |
|---|---|---|
| **<u>මූල්‍ය වියදම්</u>** | | |
| බැංකු ගාස්තු | 349,330 | 807,127 |
| බැංකු කොමිස් | 917,622 | 920,253 |
| පොළී වියදම් | 7,808,262 | 3,672,078 |
| අයකරගත නොහැකි ගෙවන ලද බදු මුදල් | 748,264 | 555,796 |
| හර බදු | 27,622 | - |
| වෙනත් බදු ( ජා ආ බ, ආ සේවා ගාස්තු හා වැට්) | 3,628,437 | 10,139,118 |
| හුවමාරු කිරීමේ ලාභය හෝ අලාභය | 28,312 | 142,270 |
| | **13,507,848** | **16,236,642** |

## සටහන් 15

| | 2013<br>රු |
|---|---|
| **<u>පෙර වර්ෂය සඳහා ගැලපීම්</u>** | |
| ගොඩනැගිලි සඳහා ක්ෂය නිවරදි කිරීම් | (356,268) |
| ගොඩනැගිලි සඳහා ක්ෂය නිවරදි කිරීම් | 17,379 |
| කැනීම් යාත්‍රා සඳහා ක්ෂය නිවරදි කිරීම් | 100,000 |
| | **(238,889)** |

## 9. විගණන හා කළමණාකාරණ කමිටු රැස්වීම

විගණන සහ කළමණාකරණ කමිටු සාමාජිකයන් - 2013

1. දර්ශනා සේනානායක මහත්මිය - අධ්‍යක්ෂ - රජයේ භාණ්ඩාගාර නියෝජිත
2. K.D.නන්දසේන මහතා - අධ්‍යක්ෂ - ලංකා ධීවර වරාය නිතිගත සංස්ථාව
3. W.A.A.D.P.අමරදිවාකර මහතා - අධ්‍යක්ෂ - ලංකා ධීවර වරායනිතිගත සංස්ථාව
4. K.K.ජයකොඩි මහතා - විගණන අධිකාරී - විගණකාධිපති දෙපාර්තමේන්තුව
5. G.G.P.අබේසේකර මහතා - සාමාන්‍යාධිකාරී - ලංකා ධීවර වරාය නිතිගත සංස්ථාව
6. සමන්ති පෙරේරා මහත්මිය - මුදල් කළමණාකාර - ලංකා ධීවර වරාය නිතිගත සංස්ථාව
7. P. S . දිසානායක මහතා - අභ්‍යන්තර විගණක - ලංකා ධීවර වරාය නිතිගත සංස්ථාව
8. H.M.A.C. බණ්ඩාර - විගනන නිලධාරි-ලංකා ධීවර වරායනිතිගත සංස්ථාව

2013 වසර තුල පැවැත් වූ විගණන සහ කළමණාකරණ කමිටු රැස්වීම්

| | | |
|---|---|---|
| 22 | පෙබරවාරි | 2013 |
| 10 | අප්‍රේල් | 2013 |
| 16 | **මැයි** | 2013 |
| 23 | ඔක්තෝබර් | 2013 |
| 02 | දෙසැම්බර් | 2013 |

# 10. විගණනකාධිපති වාර්තාව

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. } LP/B/CFHC/1/13/17    ඔබේ අංකය / உமது இல. / Your No. }    දිනය / திகதி / Date } 2015 ජූනි 19 දින

Ceylon Fishery Harbours Corporation
RECEIVED
02 JUL 2015
1587
Signature
Chairman's Office

සභාපති,

ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව.

ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාවේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව

---

යථෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න,
විගණකාධිපති (වැඩබලන)

පිටපත් : 1. ලේකම් - ධීවර හා ජලජ සම්පත් සංවර්ධනය අමාත්‍යාංශය

2. ලේකම් - මුදල් අමාත්‍යාංශය

Mgr (F)

02/07/2015

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, . - இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. · No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34    +94-11-2887223    oaggov@sltnet.lk    www.auditorgeneral.gov.lk

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
**AUDITOR GENERAL'S DEPARTMENT**

මගේ අංකය / எனது இல. / My No. } එල්පී/බී/සීඑෆ්එච්සී/1/13/17    ඔබේ අංකය / உமது இல. / Your No. }    දිනය / திகதி / Date } 2015 ජුනි 19 දින

සභාපති

ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව

**ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාවේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2) (සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.**

---

ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාවේ 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීරණ ආදායම් හා වියදම් ප්‍රකාශනය ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ 2 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2) සී වගන්තිය ප්‍රකාර සංස්ථාවේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7) (ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් සංස්ථාවේ සභාපති වෙත 2015 මාර්තු 23 දින නිකුත් කරන ලදී.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

අංක 306/72, පොල්දුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, . - இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. - No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34   +94-11-2887223   oaggov@sltnet.lk   www.auditorgeneral.gov.lk

## 1.3 විගණකගේ වගකීම

---------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ.තෝරාගත් පරිපාටින්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්වය මත පදනම් වේ.එම අවදානම් තක්සේරු කිරීම් වලදී, අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සංස්ථාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශකිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත්කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 අහිතකර මතය සඳහා පදනම

---------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලට ගැලපීම් කර තිබුණේ නම්, අනුගාමී මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බොහොමයක් මූලිකාංගවලට ප්‍රමාණාත්මක ලෙස බලපෑ හැකිව තිබුණි.

AGDSL
විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
Auditor General's Department



**2.** මූල්‍ය ප්‍රකාශන

----------------

**2.1** අහිතකර මතය

-----------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවල වැදගත්බව හේතුවෙන් 2013 දෙසැම්බර් 31 දිනට ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු නොකරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2** මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

------------------------------------------

**2.2.1** ගිණුම්කරණ ප්‍රතිපත්ති

----------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) යම් නිශ්චිත ගිණුම්කටයුත්තක් වෙනුවෙන් කටයුතු කළ යුතු ආකාරය පිළිබඳව, මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා භාවිතාකරන ලද ගිණුම්කරණ ක්‍රමයෙන් ආවරණය නොවන්නේ නම් එහිදී වඩාත්ම යෝග්‍ය ආකාරයට (Best Practice) අනුව කටයුතු කළ යුතු අතර ඒ බව සඳහන් කර ගිණුම්කරණ ප්‍රතිපත්තියක් පිළියෙල කර එය අනුගමනය කළයුතු වුවත්, සංස්ථාව විසින් රාජ්‍ය ප්‍රදාන ගිණුම්ගත කිරීම සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(ආ ) අඩමාණ ණය ලෙස සමාලෝචිත වර්ෂයේදී රු.6,070,562 ක් වෙන්කර තිබූ නමුත් අඩමාණ ණය සඳහා වෙන්කිරීමේ ප්‍රතිපත්තිය මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

**2.2.2** ගිණුම්කරණ අඩුපාඩු

----------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ගණනය කිරීමේ දෝෂ හේතුකොටගෙන සමාලෝචිත වර්ෂය තුළ වෙන්කරන ලද පාරිතෝෂික මුදල රු.150,703 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) පෙර වර්ෂයේ වැඩියෙන් ගණනය කර මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර තිබුණු රු.641,277ක් වූ ක්ෂය ප්‍රතිපාදන ගැලපීම් කිරීමට සමාලෝචිත වර්ෂයේදී ද කටයුතු කර නොතිබුණි.

(ඇ) විලම්භිත ආදායමට ගැලපිය යුතු රු.8,331,362 ට අමතරව පසුගිය වර්ෂවල ලැබී තිබුණු ප්‍රදානවලට අදාල ක්ෂය ප්‍රමාණද ආදායමට ගැලපීම හේතුකොටගෙන වර්ෂයේ ආදායම රු.164,998,596 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේදී ප්‍රදාන වශයෙන් ලැබී තිබුණු වටිනාකම රු.3,668,944 ක් වූ වත්කම් වෙනුවෙන් ක්‍රමක්ෂය ගිණුම්ගත කර නොතිබුණි.

(ඉ) වර්ෂ 05 ට වඩා වැඩි කාලයක සිට ලියා හැරිය යුතු ශේෂය ලෙස ඉදිරියට ගෙන එමින් පැවති සංස්ථාව විසින් හඳුනානොගත් රු.81,769,596 ක් ජංගම නොවන වත්කම් යටතේ දක්වා තිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂය අවසානයට වූ රු.23,807,545 ක බැංකු අයිරාව වෙනම දක්වනු වෙනුවට ජංගම වත්කම් වලින් අඩුකර දක්වා තිබුණි.

(උ) වසර හතරකට වඩා වැඩි කාලයක සිට පෙර පැවති හඳුනානොගත් ලැබීම් රු.2,215,769 ක් ප්‍රාග්ධනය හා සංචිත යටතේ දක්වා තිබූ අතර හඳුනානොගත් වගකීම් රු.1,653,400 ක් ජංගම නොවන වගකීම් යටතේ දක්වා තිබුණි.

(ඌ) වත්කම්හි සාධාරණ වටිනාකම ප්‍රමාණාත්මක නොවන මට්ටමින් වෙනස්වන විට,එම වත්කම් සෑම වසර 3 ට හෝ 5 ට වරක් ප්‍රත්‍යාගණනය කළ යුතු වුවද සංස්ථාව විසින් පිරිවැය රු.4,473,127,854 ක් වූ වත්කම් 2007 න් පසුව ප්‍රත්‍යාගණනය කර නොතිබුණි.

**2.2.3 අක්‍රිය ගිණුම්**

-------------

ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශන තුළ දිගින් දිගින් දිගටම පවතින අක්‍රිය බැංකු ගිණුම් හර හා බැර ශේෂ වල වටිනාකම පිළිවෙලින් රු.15,602,519 ක් හා රු.89,388,044 ක් විය.

**2.2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම**

-----------------------------------

එකතුව රු. 9,668,104 ක් වූ ලැබිය යුතු ගිණුම් විෂයයන් හතරක් සම්බන්ධයෙන් තහවුරු කිරීමට අදාල ලේඛන, ලියකියවිලි හා විස්තරාත්මක උපලේඛන විගණනයට ඉදිරිපත් නොවීය.

## 2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සංස්ථාව විසින් ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය වෙත සපයා තිබූ ආරක්ෂක සේවාව වෙනුවෙන් අයවීමට තිබුණු රු.7,565,194 ක් අයකරගැනීම සඳහා කටයුතු කර නොතිබුණි.

(ආ) කාර්යමණ්ඩලය සඳහා ලබාදුන් විශේෂ වැටුප් අත්තිකාරම් රු.180,201 ක් හා අනිකුත් අත්තිකාරම් රු.15,155 ක් වර්ෂයකට වඩා වැඩි කාලයක සිට අයකරගෙන නොතිබුණි.

(ඇ) සංස්ථාවට අයත් වැලිගොව්වා යාත්‍රාව 2012 ඔක්තෝබර් සිට මාසික බදු කුලී පදනම මත පෞද්ගලික සමාගමක් වෙත බදු දී තිබූ අතර අදාල සමාගම විසින් ක්‍රමානුකූලව බදු කුලී ගෙවා නොතිබුණි. සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට හිඟ බදු කුලී ආදායම රු.11,977,345 ක් වී තිබුණි.

(ඈ) වසර හතරකට වඩා වැඩි කාලයක සිට එකතුව රු.93,901,599 ක් වූ ණය හිමියන් ලබාගත් තැන්පතු හා අත්තිකාරම් ගිණුම් විෂයයන් අටක් නිරවුල් කිරීමකින් තොරව ජංගම වගකීම් යටතේ දක්වා තිබුණි.

(ඉ) වසර හතරකට වඩා වැඩි කාලයක සිට රු.2,150,000 ක් ජංගම වත්කම් යටතේ, අමාත්‍යාංශය හා අනිකුත් කොන්ත්‍රාත්කරුවන්ගෙන් ලැබිය යුතු දෑ ලෙසද රු.305,142 ක් කාර්යාල ණයගැතියන් යටතේද දක්වා තිබුණු අතර එම මුදල් සංස්ථාව වෙත අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 2.4 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීමේ අවස්ථා නිරීක්ෂණය විය.

| නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනත | අදාල මාසය අවසාන වී එළඹෙන මාසය අවසාන වීමට පෙර සේවක අර්ථසාධක අරමුදල් දායක මුදල අරමුදලට ප්‍රේෂණය කළයුතු වුවද, සමාලෝචිත වර්ෂයට අදාල රු.35,748,941 ක් 2013 දෙසැම්බර් 31 දින දක්වාම අරමුදලට ප්‍රේෂණය කර නොතිබුණි. නියමිත පරිදි අර්ථසාධක අරමුදල් නොගෙවීම හේතුකොටගෙන අධිභාර ලෙස රු.410,098 ක් සමාලෝචිත වර්ෂයේදී ගෙවා තිබුණි. |

| | | |
|---|---|---|
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| | (i) මුදල් රෙගුලාසි 104(3) | පාඩු හා හානි සම්බන්ධයෙන් එය සිදුවූ වහාම එම පාඩුවේ හා හානියේ ස්වාභාවය හා එහි වටිනාකම විගණකාධිපති වෙත වාර්තා කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂය තුළ සංස්ථාවේ වාහන දෙකකට සිදු වී තිබුණු හානි හා පාඩු සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු කර නොතිබුණි. |
| | (ii) මුදල් රෙගුලාසි 756 | සමාලෝචිත වර්ෂයට අදාල භාණ්ඩ සමීක්ෂණ වාර්තා 2015 මාර්තු 15 දින දක්වාම විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. |
| (ඇ) | 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/C2 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | පරිගණක හා පරිගණක උපාංග සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛණයක් පවත්වාගෙන යා යුතු වුවත් වටිනාකම රු.මිලියන 5 ක් වූ පරිගණක සම්බන්ධව එසේ ලේඛණයක් පවත්වා නොතිබුණි. |
| (ඈ) | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | සංස්ථාව සතු රු.මිලියන.4,468 ක් වූ ස්ථාවර වත්කම් වෙනුවෙන් වත්කම් ලේඛනයක් යාවත්කාලීන කර පවත්වා නොතිබුණි. |
| (ඉ) | 2004 අගෝස්තු 31 දිනැති අංක (353)5 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | කුලී පදනම මත වාහන ලබාගැනීමේදී ගෙවිය හැකි සීමාව ඉක්මවා රු.380,000 ක් වැඩිපුර ගෙවා තිබුණි. |

| | | |
|---|---|---|
| (ඊ) | 2011 සැප්තැම්බර් 15 දිනැති අංක පීඊඩී/58(2)දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික හා කළමනාකරණ අධ්‍යක්ෂක දීමනා ලෙස රු.450,000 ක් වැඩිපුර ගෙවා තිබුණි. |
| (උ) | 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය 9.4 වගන්තිය | (i) අනුමැතියකින් තොරව නිලධාරීන්/ සේවකයන් 17 ක් සේවයේ නියුක්ත කර රු.7,318,140 ක මුදලක් වැටුප් හා වේතන ලෙස ගෙවා තිබුණි.<br>(ii) ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශයට අයත් වාහන සඳහා ඉන්ධන වෙනුවෙන් රු.1,202,273 ක් සහ සේවා වියදම් වෙනුවෙන් රු.298,435 ක් සමාලෝචිත වර්ෂයේදී ගෙවා තිබුණි. |
| (ඌ) | 2002 පෙබරවාරි 25 දිනැති අංක 01/2002 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | සංස්ථාව සතු සියලුම වාහන සඳහා රාජ්‍ය ලාංඡනය පින්තාරු කල යුතු වුවද සංස්ථාවේ වාහනවල රාජ්‍ය ලාංඡනය පින්තාරු කර නොතිබුණි. |
| (එ) | 1997 පෙබරවාරි 03 දිනැති අංක 06/97 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | චක්‍රලේඛ විධිවිධානයන්ට පටහැනිව සංස්ථාව විසින් වැඩ බැලීමේ දීමනා ලෙස නිලධාරීන් 15 ක් සඳහා රු.263,011 ක් ගෙවා තිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුළ ආයතනයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.41,511,370 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.258,826,672 ක් විය.ඒ අනුව ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.217,315,302 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි.මේ සඳහා ප්‍රධාන වශයෙන් මෙහෙයුම් ආදායම් හා පුනරාවර්තන වියදම් සඳහා ලද ප්‍රාග්ධන ප්‍රදාන වැඩිවීමත් අළුත්වැඩියා වියදම් හා මූල්‍ය පිරිවැය අඩුවීමත් හේතු වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්ය සාධනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සංස්ථාව සතු ධීවර වරායයන් 20 කින් ධීවර වරාය 09 ක් රු.මිලියන 04 සිට රු.මිලියන 11 ක් දක්වා පරාසයක මෙහෙයුම් අලාභ ලබමින් තිබුණි.

(ආ) ධීවර වරායයන් 02 ක මෙහෙයුම් අලාභය ඉකුත් වර්ෂයට සාපේක්ෂව සියයට 32 සිට 43 දක්වා පරාසයක් තුළ අඩුවී තිබුණි.

### 4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සංස්ථාව තුළ නීති නිලධාරින් 03 දෙනෙක් හා නීති උපදේශකවරයෙකු සේවයේ යෙදී සිටියද සමාලෝචිත වර්ෂයේ දී නීති වියදම් ලෙස රු.1,943,406 ක් බාහිර පුද්ගලයින් වෙත ගෙවා තිබුණි.

(ආ) සැපයුම් අංශය විසින් භාණ්ඩ මිලදී ගැනීම සඳහා වර්ෂ පහකට වඩා වැඩි කාලයක සිට ලබා දී තිබූ රු.46,378,763 ක් වූ කලින් ගෙවීම් අත්තිකාරම් සමාලෝචිත වර්ෂය අවසානය වන විටද නිරවුල් කර නොතිබුණි.

(ඇ) වසරකට වඩා වැඩි කාලයක සිට බැංකු ගිණුම් 08 ක පිළිවෙලින් රු.88,055 ක් වූ හර ශේෂයන් හා රු.224,749 ක් වූ බැර ශේෂයන් නොවෙනස්ව පැවති අතර සමාලෝචිත වර්ෂය අවසානයට ක්‍රියාකාරී තත්ත්වයේ නොපවතින එම බැංකු ගිණුම් වසා දැමීමට සංස්ථාව කටයුතු කර නොතිබුණි.

(ඈ) දේශීය ආදායම් දෙපාර්තුමේන්තුව වෙත කොන්ත්‍රාත්කරුවකු විසින් සෘජුව ගෙවා තිබුණු එකතු කළ අගය මත බදු මුදල වූ රු.10,434,780 ක් නැවත අයකරගැනීමට හැකියාව සම්බන්ධයෙන් 2015 අප්‍රේල් 30 දක්වාම අවසන් එකඟතාවයකට පැමිණ නොතිබුණි.

(ඉ) වසර හතරකට වඩා වැඩි කාලයක සිට එකතු කළ අගය මත බදු ගෙවිය යුතු හා ලැබිය යුතු ලෙස පිළිවෙලින් රු.67,976,923 ක් හා රු.36,535,669 වූ අතර එය නිරවුල් කිරීම සඳහා කටයුතු කර නොතිබුණි.

(ඊ) මූල්‍ය ප්‍රකාශනවල ගැලපුම් කළයුතු රු.82,815,786 ක සංචිත මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ ආයෝජන ක්‍රියාකාරකම් යටතේ ගැලපුම් කිරීම හේතුවෙන් ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනනය වූ මුදල් ප්‍රමාණය මූල්‍ය ප්‍රකාශන තුළ එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

**4.3 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

-----------------------------------

පහත සදහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) තල්මසුන් හා ඩොල්ෆින් මසුන් නැරඹීමේ විදේශීය හා දේශීය ව්‍යාපෘතියේ සම්බන්ධිකාරක තනතුර සඳහා සංස්ථාවේ බඳවා ගැනීමේ පරිපාටියට පටහැනිව පුද්ගලයෙකු සමාලෝචිත වර්ෂයේදී බඳවා ගෙන තිබුණි.

(ආ) වටිනාකම රු.2,611,128 ක් වූ බීකන් ලාම්පු මිලදී ගැනීමේදී අදාල ප්‍රදානය ලබාගත් ආයතනය ලිපිනයන් දෙකකින් ලංසු ඉදිරිපත් කර තිබුණු බවත් ඉන්වොයිසිපත් හා ටෙන්ඩර් ලියවිලි නිකුත් කර තිබුණු ස්ථානය පරීක්ෂා කිරීමේදී එම ලිපිනයෙහි එවැනි ආයතනයක් නොමැති බවත් එය පෞද්ගලික නිවසක් බවටත් අනාවරණය විය.

(ඇ) එකම දින එකම අංකයක් මගින් සභාපති අත්සනින් නිකුත් කර තිබුණු ලිපි දෙකක් වංචනිකව වෙනස් කර ජ්‍යේෂ්ඨ විමර්ශන නිලධාරීයෙකුට දීමනා වශයෙන් සමාලෝචිත වර්ෂය තුළ රු.26,000 ක් වැඩියෙන් ගෙවා තිබුණි.

(ඇ) යම් තනතුරකට මුලින්ම පත්කරන නිලධාරියා එම තනතුරට හිමි වැටුප් පරිමාණයේ ආරම්භක පියවරෙහි තැබිය යුතු වුවත් ඉන් බැහැරව නිලධාරින් පස් දෙනෙකුට පරිවාස සේවා කාලය තුළ විවිධ වැටුප් පියවරයන්හි පිහිටුවා තිබුණි.

(ඉ) ධීවර වරායන් සඳහා ඉන්ධන ටැංකි 06 ක් සැපයීම, ප්‍රවාහනය හා සවිකිරීම සඳහා අත්තිකාරම් වශයෙන් පුද්ගලික සමාගමකට 2007 වර්ෂයේදී රු.1,691,215 ක් ගෙවා තිබූ නමුත් මෙම ඉන්ධන ටැංකි 2015 මාර්තු 20 දින දක්වාම සංස්ථාවට ලැබී නොතිබුණි. එම වියදම නිෂ්ක්‍රීය වියදමක් බවට පත්වී තිබූ අතර ගෙවූ මුදල අදාල පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 4.4 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අභ්‍යන්තර දුරකථන පද්ධතියක් ස්ථාපිත කිරීම වෙනුවෙන් 2007 වර්ෂයේදී රු.13,455,059 ක් වැය කර තිබූ අතර එයට අමතරව මාසික ගාස්තු ලෙස රු.11,566,705 ක් සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුද්ගලික සමාගමකට ගෙවා තිබුණි. කෙසේ වුවද මෙම දුරකථන පද්ධතිය වරායන්වල සම්පූර්ණයෙන්ම අක්‍රිය වී තිබීම හේතුවෙන් ඒ සඳහා දරන ලද පිරිවැය හා අනෙකුත් වියදම් නිෂ්කාර්ය වියදමක් බවට පත්වී තිබුණි.

(ආ) තක්සේරු වටිනාකම රු.3,400,000 ක් වූ මෝටර් වාහන 03 ක් වර්ෂයකට වැඩි කාලයක සිට ප්‍රයෝජනයට නොගෙන නිෂ්ක්‍රීය ලෙස ආයතන පරිශ්‍රය තුළ ගාල්කර තිබුණි.

## 4.5 ආර්ථික නොවන ගනුදෙනු

ආසියානු සංවර්ධන බැංකුවේ සහ වෙරළ සම්පත් කළමනාකරණ ව්‍යාපෘතියේ ආධාර මත රු.මිලියන 224 ක වියදමින් හලාවත ධීවර වරාය ඉදිකර තිබුණු අතර අවශ්‍ය අනෙකුත් යටිතල පහසුකම් නොමැතිවීම හේතුවෙන් එය නිසි පරිදි ක්‍රියාත්මක නොවන බැවින් එම ඉදිකිරීම සහ ඒ සඳහා අනුයුක්ත කර තිබුණු නිලධාරීන්/ සේවකයන් 27 දෙනෙකුගේ සේවය ද නිෂ්කාර්ය වී තිබුණි.

## 4.6 හඳුනාගන්නා ලද පාඩු

මෝදර ධීවර වරාය තුළ නැංගුරම් ලා තිබූ යාත්‍රාවකින් අයවිය යුතුව තිබූ නැංගුරම් ගාස්තුව රු.10,520,113 ක් වුවද ඉන් රු.4,844,739 ක මුදලක් පමණක් ගෙවා තිබියදී යාත්‍රාව නිදහස් කිරීම හේතුකොටගෙන සිදු වී තිබුණු මූල්‍යමය අලාභය රු.5,675,374 ක් විය. කෙසේවෙතත් මේ සම්බන්ධයෙන් කොළඹ වාණිජ මහාධිකරණයේ නඩුවක් විභාග වෙමින් පැවතුණි.

4.7 කාර්ය මණ්ඩල පරිපාලනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සංස්ථාවේ අනුමත සේවක සංඛ්‍යාව 1,015 ක් වූ අතර, තථ්‍ය සේවක සංඛ්‍යාව 1,258 ක් වූයෙන් අතිරික්ත සේවක සංඛ්‍යාව 243 ක් විය.ඒ අනුව අනුමත සේවක සංඛ්‍යාව හා සැසඳීමේදී අතිරික්ත සේවක සංඛ්‍යාව සියයට 24 ද ඉක්මවා තිබුණි.

(ආ) බඳවාගැනීමේ පරිපාටිය සකස්කර ජාතික වැටුප් හා සේවක සංඛ්‍යාව කොමිෂන් සභාව වෙත යොමුකර අනුමැතිය ලබා නොතිබුණි.

5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී - 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ විධිවිධාන පරිදි මූල්‍ය ප්‍රකාශන මුදල් වර්ෂය ඉකුත්වී දින 60 ක් ඇතුළත විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, 2014 ජූලි 23 දින ඉදිරිපත් කළ සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2014 සැප්තැම්බර් 27 දින නැවත සංශෝධනය කිරීමට ආපසු ලබාගත් අතර සංශෝධිත මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කරන ලද්දේ 2015 ජනවාරි 20 දින දීය.

5.2 ක්‍රියාකාරී සැලැස්ම

සමාලෝචිත වර්ෂය සඳහා වූ ක්‍රියාකාරී සැලැස්ම විගණනය සඳහා ඉදිරිපත්කර නොතිබුණි.

5.3 අභ්‍යන්තර විගණනය

අභ්‍යන්තර විගණන අංශයක් ක්‍රියාත්මක වුවද ප්‍රධාන අභ්‍යන්තර විගණක තනතුර 2013 නොවැම්බර් 20 දින සිට පුරප්පාඩුව පැවති අතර එයට විගණන නිලධාරීන් දෙදෙනෙක් පමණක් අනුයුක්ත කර තිබුණි. සමාලෝචිත වර්ෂයේදී ප්‍රමාණවත්, ක්ෂේත්‍රයක් අභ්‍යන්තර විගණනයෙන් ආවරණය වී නොතිබුණි.

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
Auditor General's Department



5.4 අයවැය ලේඛනමය පාලනය

----------------------------------

අයවැයගත සංඛ්‍යා හා තථ්‍ය සංඛ්‍යා අතර සැලකිය යුතු විචලනයක් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛණය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොතිබුණි.

5.5 නොවිසඳී ඇති විගණන ඡේද

----------------------------------

සංස්ථාවේ සභාපතිවරයා වෙත 2013 ගිණුම් වර්ෂයට අදාලව යොමු කරන ලද විගණන විමසුම් 08 ක් සඳහා 2015 මාර්තු 20 දින දක්වාම පිළිතුරු ලබා දී නොතිබුණි.

6. පද්ධති හා පාලනයන්

------------------------

පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින්වර සභාපතිවරයාගේ අවධානයට යොමුකර ඇති අතර පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් පිළිබඳව විශේෂ අවධානය යොමුවිය යුතුවේ.

(අ) අයවැය පාලනය
(ආ) ආදායම් පාලනය
(ඇ) වත්කම් කළමනාකරණය
(ඈ) මිලදී ගැනීම්

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න
විගණකාධිපති (වැඩබලන)